# මිනිසත් බවට පුනර්ජීවනයක්

## ජන බලයට නව නැම්මක්











ශ්‍රී ලංකා ජනරජයේ අතිගරු ජනාධිපතිනී
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය
ජනාධිපති ධුරයට පත්වීමේ 8 වන සංවත්සරය
2002 නොවැම්බර් 12

BKT 0234
26/08/2023

ජනාධිපති ලේකම් කාර්යාලය
18 JUN 2003
පුස්තකාලය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# මිනිසත් බවට පුනර්ජීවනයක්

## ජන බලයට නව නැම්මක්

ශ්‍රී ලංකා ජනරජයේ අතිගරු ජනාධිපතිනී
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය
ජනාධිපති ධුරයට පත්වීමේ 8 වන සංවත්සරය

*2002 නොවැම්බර් 12*



BKT 0234
26/08/2023

ජනාධිපති ලේකම් කාර්යාලය
18 JUN 2003
පුස්තකාලය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# මිනිසත් බවට පුනර්ජීවනයක්

## ජන බලයට නව නැම්මක්

ශ්‍රී ලංකා ජනරජයේ අතිගරු ජනාධිපතිනි
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය
ජනාධිපති ධුරයට පත්වීමේ 8 වන සංවත්සරය

*2002 නොවැම්බර් 12*

# පෙරවදන

චන්ද්‍රිකා යන නම ශ්‍රී ලංකාවේ දේශපාලන කරළියේ රැව්පිළිරැව් දෙන්නට පටන් ගත්තේ අද ඊයේ නොවේ. එම ඉතිහාසය 70 දශකයේ අගභාගය තරම් ඈතට දිවයයි. එහෙත් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ශ්‍රී ලංකාවේ දේශපාලන භූමිකාවේ ඉහළින්ම කැපී පෙනෙන චරිතය බවට පත්වූයේ 1994 ඇය ලබාගත් ඓතිහාසික මැතිවරණ ජයග්‍රහණය සමගයි. එම මැතිවරණයේදී පොදුජන එක්සත් පෙරමුණ ජයග්‍රහණය කරා මෙහෙය වීමට ඇයට හැකිවිය. මැතිවරණයෙන් පසු ඇය දිවුරුම් දුන්නේ ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය තනතුරට පත්වූ දෙවන කාන්තාව හැටියටයි. එම වසරේම නොවැම්බර් මාසය වනවිට චන්ද්‍රිකා ශ්‍රී ලංකා දේශපාලන ක්ෂේත්‍රයේ ඉහළින්ම බැබළෙන්නට පටන් ගත්තේ මින්පෙර නොවූ විරූ සියයට 62 කට වැඩි ජනවරමකින් ජනාධිපති ධූරයට පත්වූ විටය. "සියලු ශ්‍රී ලාංකිකයිනට අභිමානය සපිරි සාමය" යන්න ඇයගේ මැතිවරණ හා ජනාධිපතිවරණ පොරොන්දුව විය.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංගට මුහුණ දෙන්නට සිදුවූයේ ශ්‍රී ලංකා ඉතිහාසයේ බිහිසුණු කාල පරිච්ඡේදයකින් පසු උදාවූ දේශපාලන පරිසරයකටය. ඇය බලයට පත්වන විට එක් පැත්තකින් උතුරු නැගෙනහිර බෙදුම්වාදී යුද්ධයෙන්ද, අනෙක් පැත්තෙන් දකුණේ තරුණ කැරැල්ලෙන්ද තවත් පැත්තකින් රාජ්‍ය ත්‍රස්තවාදයෙන්ද මුලුමහත් රටම ගිනිගෙන තිබුණි. ජනතාව අතර පැතිර තිබුණේ බියජනක මානසිකත්වයකි. ආර්ථිකය සම්පූර්ණයෙන්ම අඩාල වී තිබුණි.

රටේ නායකත්වය භාරගැනීමට වසර කිහිපයකට කලින්ම චන්ද්‍රිකා අතින් වැදගත් කාර්යයක් ඉටු විය. එනම් පොදුජන එක්සත් පෙරමුණේ ප්‍රධානම පක්ෂය වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇතැම් සම්ප්‍රදායික ප්‍රතිපත්තිවල වෙනසක් ඇති කිරීමය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බිහිවන අවධියේ එම පක්ෂය අනුගමනය කළ ප්‍රතිපත්ති විශේෂයෙන්ම, ජාතිකවාදී නැඹුරුවක් සහිත ප්‍රතිපත්ති සත්‍ය වශයෙන්ම යුගයේ අවශ්‍යතාවන් පිළිබිඹු කළ ප්‍රගතිශීලී ප්‍රතිපත්ති විය. විශේෂයෙන්ම සිංහල බසට ප්‍රමුඛත්වය දී බුදු දහම මුල්තැනෙහිලා සැලකීම ප්‍රධාන කොට ගනිමින් සඟ, වෙද, ගුරු, ගොවි කම්කරු බලවේග එක්තැන් කිරීමට එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හැකිවීම අමතක නොකළ හැකි ජයග්‍රහණයකි. එහෙත් දිවංගත අගමැති එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් නායකත්වය දුන් මේ ජාතික විප්ලවය ජයග්‍රහණය කිරීමෙන් පසු වෙනස් වන දේශීය හා ජාත්‍යන්තර අවශ්‍යතාවන්ට අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්ති යළි සැකසීමේ කාර්යයට මුහුණ දුන්නේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියයි.

චන්ද්‍රිකා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිර්මාතෘවරයා වූ දිවංගත අගමැති එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ගේ දියණියකි. එසේම ඇය පක්ෂය දිවි හිමියෙන් ආරක්ෂා කළ දිවංගත අගමැතිනී සිරිමාවෝ බණ්ඩාරනායක නමැති පක්ෂ නායිකාවගේ දියණියයි. සිය දෙමව්පියන්ගෙන් පක්ෂයට ලැබුණු අභීත නායකත්වය හා එහි සාම්ප්‍රදායික උරුමයන් ආරක්ෂා කර ගනිමින්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කාලීන අවශ්‍යතාවන්ට ගැලපෙන නව ජනතාවාදී පක්ෂයක්, වඩාත් පැහැදිලිව කිවහොත්, නව සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් බවට පරිවර්තනය කිරීමේ අභියෝගය භාර ගත්තේ කුමාරතුංග ජනාධිපතිනියයි.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ මුළු දේශපාලන ජීවිතයම මේ රටේ සාමය සඳහා වූ අරගලයත්, ජනවාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් ලබා ගැනීමේ අරගලයත් සමග වෙන් නොකළ හැකි අයුරින් බැඳී පවතී. 80 දශකයේදී තරුණ ක්‍රියාකාරිනියක ලෙස දේශපාලනයට පිවිසි ද සිටම ඇය සටන් කළේ සාමය සඳහාය. ඇය සිය සැමියා වූ විජය කුමාරතුංග සමග එක්ව මේ රටට තිරසාර සාමයක් උදාකර ගැනීමේ පරම අභිලාෂයෙන් කටයුතු කළාය. උතුරේ සන්නද්ධ කණ්ඩායම් සමග සාකච්ඡා කිරීම සඳහා ඇය සිය සැමියා සමග මදුරාසියට ගියාය. විජය යාපනයට යනවිට ඔහුට එම ගමන සඳහා සම්පූර්ණ ආශිර්වාදයත් සහයෝගයත් ලැබුණේ චන්ද්‍රිකාගෙනි.

1994 දී අග්‍රාමාත්‍යවරිය ලෙස පත්වීමත් සමගම චන්ද්‍රිකා එල්.ටී.ටී.ඊය සමග සාම සාකච්ඡා ආරම්භ කළාය. ඒ සාකච්ඡා ආරම්භ වූයේ ඇය ජනාධිපතිනිය ලෙස දිවුරුම් දෙන්නටත් කලිනි. සාම සාකච්ඡා මාස පහක් මුළුල්ලේ පැවැත්විණි. සටන් විරාමය නිරීක්ෂණය සඳහා විදේශීය නියෝජිතයෝද පැමිණියහ. මෙසේ පැමිණියේ කැනඩා, නෝර්වේ සහ ඕලන්ද ජාතිකයෝය. එහෙත් ඔවුන්ට සිය වැඩ කටයුතු කරගෙන යාමට ප්‍රභාකරන් ඉඩ දුන්නේ නැත. එල්.ටී.ටී.ඊයේ එකම අභිලාෂය වූයේ ආර්ථික හා වෙනත් අංශ වලින් උපරිම වාසි සලසා ගැනීමය. ප්‍රශ්නයට අවසාන විසඳුමක් ලබාගැනීම ගැන ඔවුන් කල්පනා කළේ නැත. සියලු වරප්‍රසාද ලබාගනිමින් සැම අතින්ම ශක්තිමත් වන අතර උතුරු නැගෙනහිර නිල නොවන පාලනයක් පවත්වා ගෙනයාම ඔවුන්ගේ ඉලක්කය විය. 1995 අප්‍රේල් මාසයේදී ප්‍රධාන ප්‍රශ්න ගැන සාකච්ඡා කිරීමට ජනාධිපතිනිය යෝජනා කළවිට එල්.ටී.ටී.ඊය එය මගහරිමින් යළිත් යුද්ධය ආරම්භ කළේය.

මේ යුද්ධයෙන් අහිමිවූයේ එල්.ටී.ටී.ඊ. සංවිධානයේත්, රජයේ හමුදාවේත් සෙබළුන්ගේ ජීවිත පමණක් නොවේ. අහිංසක සිවිල් වැසියන්ගේ ජීවිතද විශාල ගණනාවක් විනාශ විය. එසේම එල්.ටී.ටී.ඊ. සංවිධානය යනු දෙමළ ජනතාවගේ පරම නියෝජිතයාය යන්න පිළිනොගත් මධ්‍යස්ථ දෙමළ නායකයින් ගණනාවක්ද එල්.ටී.ටී.ඊ. ය මගින් මරණයට පත්වූහ.

බලය බෙදාහැරීමේ දේශපාලන විසඳුම් ක්‍රියාවලිය පදනම් කර ගනිමින් කලාපවලට පුළුල් ලෙස බලතල ලබා දෙන්නාවූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත 1997 දී ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිණි. ජනවාර්ගික ගැටුමට එකම විසඳුම ලෙස ඇය දුටුවේ පුළුල් ස්වයං පාලනය සහිතව කලාපවලට බලය බෙදාහැරීමය. මෙම යෝජනා විවිධ ප්‍රසිද්ධ වේදිකාවලදී සාකච්ඡාවන්ට හා විවාදවලට බඳුන්විය. අවසාන වශයෙන් මෙම ව්‍යවස්ථා කෙටුම්පත සම්බන්ධයෙන් පුළුල් එකඟතාවක්ද ඇතිවිය. එය පාර්ලිමේන්තු තේරීම් කාරක සභා වාර 77 කදී සාකච්ඡාවට ලක්විය. වසර 2000 මාර්තුවේ සිට ජූලි දක්වා වූ කාලය තුළදී මේ පිළිබඳව සියලුම ප්‍රධාන පෙළේ දේශපාලන පක්ෂවල අදහස් විමසන ලදී. ව්‍යවස්ථා කෙටුම්පත විධිමත්ව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ දවස වනතුරුම පාහේ මෙම සංවාදය පවත්වාගෙන යනු ලැබිණි. 2000 අගෝස්තු 03 වැනිද ජනාධිපතිනිය විසින්ම මෙම ව්‍යවස්ථා කෙටුම්පත රටේ උත්තරීතර ව්‍යවස්ථාදායකයට ඉදිරිපත් කළ අවස්ථාව ඓතිහාසික සිද්ධියකි. එය නීතියක් බවට පත්වීමට අවශ්‍ය තුනෙන් දෙකේ බලය නොලැබී එය සම්මත වීම වැළකී ගියද වත්මන් සාම ක්‍රියාවලියේ සාකච්ඡාවල පදනම ලෙස මෙය යොදාගත හැකි බව අග්‍රාමාත්‍යවරයා ප්‍රකාශ කළ බව වාර්තා වී ඇත.

ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ තුළින් හඳුන්වාදෙන බලය බෙදාහැරීමේ ක්‍රමයක් අනුසාරයෙන් සාමය උදාකර ගැනීමට වෙහෙස මහන්සි වී වැඩකළ ජනාධිපතිනිය 1998 මැද භාගයේදී තුන්වන පාර්ශවයේ මැදිහත්කරුවෙකු ලෙස පැමිණෙන්න යැයි නෝර්වේ රාජ්‍යයට ඇරයුම් කළාය. එහෙත් ඒ බව ප්‍රසිද්ධියට පත් වූයේ 1999 වර්ෂයේදීය. ජනාධිපතිනිය ඇරඹූ සාම ක්‍රියාදාමය වත්මන් ආණ්ඩුව ඉදිරියට ගෙනයනු දැකීම සතුටට කරුණකි. ශ්‍රී ලාංකිකයන්ගේ සිහිනය වන්නේ මේ සාම ක්‍රියාදාමය පටු දේශපාලනයෙන් මුදා අවංක ජාතික ක්‍රියාවලියක් බවට පත්වනු දැකීමය. එක් රටක් තුළ සියලුම ජන කොටස්වලට පිළිගත හැකි සාමයක් කඩිනමින් උදාවේවායි අපි ප්‍රාර්ථනා කරමු.

මෙම නොවැම්බර් 12 වැනි දිනට චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ජනාධිපතිනි පදවියට පත්වීමේ අටවන සංවත්සරය යෙදේ. ජනාධිපතිනිය ලෙස ඇය සිය මුළු ජීවිතයම කැපකර ඇත්තේ යුද්ධයෙන් හා ආර්ථික පීඩනයෙන් රෝගාතුරවූ සමාජයක් සුවපත් කිරීමේ කාර්යය සඳහාය. මේ පොතේ ඉදිරි පරිච්ඡේදවල පළවන ලිපිවලින් අපේ දූ දරුවන්ට යහපත් රටක් නිර්මාණය කරදීම සඳහා වන අපේ ඉදිරි දර්ශනය හා ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි වෙතැයි අපි විශ්වාස කරමු.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



*1986 - සාම ප්‍රයත්නයන් දැරූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග*
*තම දිවංගත සැමියා වූ විජය කුමාරතුංගයන් සමඟ*

# අභිමානය සපිරි සාමය

ජාතියක් වශයෙන් අපි අද ප්‍රබල අභියෝගයකට මුහුණ දී සිටිමු. ශ්‍රී ලංකාවාසී ජනතාව දැන් සිටින්නේ අතිශයින් තීරණාත්මක මොහොතකයි. බහුවිධ සමාජයක් ගොඩනැගීම අද අපි ඉදිරියේ ඇති ප්‍රධාන අවශ්‍යතාවයි. නිදහසින් පසු 54 වසරක් ගතවී ඇතත් මෙම අභියෝගය ජය ගැනීමට අපි තවමත් අපොහොසත් වී සිටිමු.

ශ්‍රී ලංකාව විවිධ ජන වර්ගවලට හා විවිධ භාෂා කථා කරන ජන කොටස් වලින් සමන්විතය. මේ සෑම ජන කොටසකටම ස්වකීයමයවූ ඓතිහාසික සංස්කෘතියක් ඇත. මේ සියලුම වටිනා සංස්කෘතීන් ආරක්‍ෂා කොට වර්ධනය කිරීමට ඉඩකඩ ලැබෙන සමාජ දේශපාලන පරිසරයක් නිර්මාණය කිරීම මගේ දැක්මයි. ශක්තිමත් වූ සාමයක් දිනා ගනිමින් අපගේ සියලු ජනතාවට සමානාත්මතාව, සුරක්ෂිතභාවය සහ සමාජ සාධාරණත්වය යහතික කිරීම සඳහා අපට උරුම වී ඇති විවිධත්වයේ ශක්තිය අප උකහා ගත යුතුය.

බහුවිධ සමාජයක් ශක්තිමත් කොට වර්ධනය කර ගැනීමට අපට නොහැකිවීම ඇත්තෙන්ම ඛේදජනකය. මෙවැනි ඛේදවාචකයකට අත්‍යාවශ්‍යයෙන්ම විළියම් සෙවීමේ අවශ්‍යතාව පිළිගත් අපේ රටේ දේශපාලන නායකයින් හා ආණ්ඩු අනේක වතාවක් ඒ සඳහා උත්සාහ දැරුවද එම අරමුණු මුදුන්පමුණුවා ගැනීමට අපට නොහැකි විය.

මෙම අසාර්ථකත්වයේ ප්‍රතිඵලය වූයේ ගතවූ දශක දෙකකට වැඩි කාලය තුළදී බිහිසුණු ප්‍රචණ්ඩත්වයක් සහිත වාර්ගික ගැටුම් උත්සන්නවීමයි. උතුම්වූ ඉපැරණි ශිෂ්ඨාචාරයකට හිමිකම් කියන, ලෝකයේ ශ්‍රේෂ්ඨ සංස්කෘතික හා වාස්තු විද්‍යාත්මක උරුමයන්ගෙන් පොහොසත්වූ සාමය, ඉවසීම හා කරුණාව පදනම් කරගත් උදර බෞද්ධ දර්ශනයෙන් පෝෂණයවූ, ඓතිහාසික වශයෙන් ශ්‍රේෂ්ඨ ජාතියක්වූ, වාර්ගික දේශපාලන සහ සමාජ ප්‍රචණ්ඩත්වය උග්‍රවූ බිහිසුණු ඛේදවාචකයකට ඇද වැටෙද්දී අපේ රටේ බහුතර ජනතාව කරකියා ගතහැකි දෙයක් නොමැතිව අසරණ වී, නිසලව බලා සිටියහ.

සියලුම රටවැසියන්ගේ විශේෂයෙන්ම වාර්ගික වශයෙන සුළුජන කොටසකට අයත්වූ වැසියනගේ ප්‍රජාතන්ත්‍රවාදී නිදහස් සහ මානව අයිතීන් ආරක්‍ෂා කරදීමට අපේ දේශපාලන හා පරිපාලන ආයතනවලට නොහැකිවීම නිසා අපේ ජනතාව අතර විරෝධය හා අන්‍යෝන්‍ය සැක සංකා නිර්මාණය විය. අපේ දේශයේ සිංහල ජනතාව සමග සියවස් ගණනාවක් සාමයෙන් හා සමගියෙන් ජීවත්වූ දමිළ ජනතාවට එරෙහිව සංවිධානයවූ ප්‍රචණ්ඩ මැර කණ්ඩායම් විසින් සිදු කරන ලද දැඩි සමාජ අසාධාරණත්වය හා තිරශ්චීන සාපරාධී ක්‍රියා අදහාගත නොහැකි තරම්ය.

දෙමළ ජනතාවට එරෙහිව සිදුකළ මේ නින්දිතවූ සාපරාධී ක්‍රියා වළක්වාලීමට එදා පැවති ආණ්ඩුව අපොහොසත්වීම හේතුකොට ගෙන අපේ ඉතිහාසයට මකාලිය නොහැකි කළු ලපයක් එක්විය. 1983 ජූලි මාසයේදී ඇතිවූ මේ බිහිසුණු ඛේදවාචකය හේතුකොට ගෙන මතුවූ කැකෑරෙන වාර්ගික නොසන්සුන්තාව පූර්ණ සන්නද්ධ ගැටුමක් බවට පරිවර්තනය වූ අතර, එමගින් එල්.ටී.ටී.ඊ. සංවිධානයට වඩාත් ශක්තිමත්වූ බිහිසුණු සංවිධානයක් බවට වර්ධනය වීමට පමණක් නොව අතිශයින් ක්‍රියාකාරී අන්තර්ජාතික ජාලයක් සහිත ව්‍යාපාරයක් බවට වර්ධනය වීමටද අවස්ථාව උදාවිය.

ත්‍රස්තවාදී සංවිධාන බිහිවීම වර්ධනය වීමට බලපාන්නාවූ ප්‍රධාන හේතුව වන්නේ සමාජය තුළ කොන්වීම් ඇතුළු සමාජ අසාධාරණත්වය හේතුකොට ගෙන ඇති වන බලාපොරොත්තු කඩවීම හා මංමුලාවීම බවට විශ්වාසයක් පවතී. අපේක්ෂා භංගත්වය සහ රට තුඩුදුන් දශසකුත් එකක් අසාධාරණ ක්‍රියා හේතුකොට ගෙන තරුණ තරුණියෝ වීරත්වයක් ආරෝපණය කරගත් මරාගෙන මැරෙන සජීවී බෝම්බ බවට පත්වෙති. මේ සමාජ දේශපාලන අසාධාරණත්වය සහ සමාන හා සාධාරණ ආර්ථික අවස්ථා අහිමි කිරීම තවදුරටත් මේ ආකාරයෙන්ම සිදුවුවහොත් එහි ප්‍රතිඵලය වන්නේ අපේක්ෂා භංගත්වය තවදුරටත් උත්සන්න වී අවසානයේ තරුණ පරපුර ප්‍රචණ්ඩත්වයට පෙළඹීමයි. ත්‍රස්තවාදයට මූලික වන ප්‍රධාන කාරණා දෙකක් වන්නේ අපේක්ෂා භංගත්වය සහ පළිගැනීමේ චේතනාව බව ලියෝන් ට්‍රොට්ස්කි වරක් පැහැදිලි කළේය.

ජනතාවට විරුද්ධව රාජ්‍ය හෝ රාජ්‍ය නියෝජිතයින් විසින් ප්‍රචණ්ඩත්වය ඇති කරනු ලබන විට සිදුවන්නේ ත්‍රස්තවාදය තවදුරටත් වර්ධනය වීම පමණකි. රජය මර්ධනකාරී ලෙස එකට එක කිරීමෙන් ත්‍රස්තවාදය දිගින් දිගටම පෝෂණය වෙයි.

එල්.ටී.ටී.ඊ. සංවිධානය නැවත වරක් දැන් සාකච්ඡා මේසයට පිවිස සිටී. මෙය ප්‍රධාන වශයෙන්ම පසුගිය වසරේ සැප්තැම්බර් 11 වැනිදා නිව්යෝර්ක් නුවර සිදුවූ බිහිසුණු ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් පසුව අන්තර්ජාතික වශයෙන් ඇතිවූ තත්ත්වයේ ප්‍රතිඵලයකි. බ්‍රිතාන්‍යය, ඉන්දියාව, කැනඩාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය වැනි රටවල් ගණනාවක් විසින් එල්.ටී.ටී.ඊය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබීමත් ඕස්ට්‍රේලියාව සහ ස්විට්සර්ලන්තය වැනි රටවල එල්.ටී.ටී.ඊ. සංවිධානයේ මුදල් රැස්කිරීම් වැනි කටයුතුවලට සීමා මායිම් පැනවීමත් එල්.ටී.ටී.ඊය ආණ්ඩුව සමග සාකච්ඡාමය විසඳුමකට පිවිසීමට බලපෑ තවත් ප්‍රබල හේතුවක් විය.

ත්‍රස්තවාදයට එරෙහිව එවැනි පසුබිමක් හා අන්තර්ජාතික ප්‍රතිචාරයක් ඇති අවස්ථාවක ආණ්ඩුව හා එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර යුද්ධමය ගැටුම් වෙනුවට දේශපාලනමය සංවාදයක් ආරම්භ වී තිබීම තීරණාත්මක වන අතර එය සාමය සඳහා අවස්ථාවක් උදාවීමක් ලෙස සැලකේ. මෙම ක්‍රියාදාමය අර්ථාන්විත අයුරින් තවදුරටත් ඉදිරියට ගෙනයාම වැදගත්ය. ඵලදායී සංවාදයක් හා සාධාරණීයවූ අන්‍යෝන්‍ය සම්ථයක් තුළින් දෙපක්ෂය අතර ඇති පරතරය හැකිතාක් දුරට පියවා ගත යුතුය.

එවැනි අර්ථාන්විත සංවාදමය ක්‍රියාදාමයකදී හා සාකච්ඡාවකදී සියලු ජනතාවගේ, විශේෂයෙන්ම උතුරු නැගෙනහිර ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී හා මානව අයිතිවාසිකම් කෙරෙහි සැළකිලිමත්වීම අත්‍යාවශ්‍යය. එසේම රටේ සෙසු

සාමය සඳහා සුදු නෙළුම් ව්‍යාපාරය දියත් කිරීම



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ අයිතිවාසිකම් යටපත් නොකොට හා එවා පාවානොදී මේ අයිතීන් ලබාදිය යුතුය.

බහුවිධ සමාජයක් ගොඩනැගීමට අපොහොසත්වීම හේතු කොටගෙන අපේ රටේ සමාජ ආර්ථික සංවර්ධනයට බාධා පැමිණියේය. ඒ නිසාම අපේ ජනතාවගේ අවශ්‍යතාවන්ට හා අපේක්ෂාවන්ට සරිලන පරිදි සංවර්ධනයක් ඇතිකර ගැනීමට අපට නොහැකි විය. සාමය හා සමගිය රජයන බහුවිධ සමාජයක් නිර්මාණය කිරීම සඳහා මා මගේ මුළු දේශපාලන ජීවිතය තුළම ඇපකැපව ක්‍රියාකළ බව මා ප්‍රකාශ කරන්නේ ආඩම්බරයෙන් යුතුවය. 1987 දී අත්සන් තැබුණු ඉන්දු ලංකා ගිවිසුම ප්‍රශ්නයට නියම විසඳුම නොවූවත් ඒ අවස්ථාවේදීත් මම ඊටද සහයෝගය දැක්වීමි.

ගැඹුරු ලෙස මුල් බැසගෙන ඇති සැක සංකා දුරුකොට, අපේ සමාජයේ ඇති විවිධාකාරවූ බෙදීම් සමනය කොට අමිහිරි අතීතය වළලා දැමීමට ක්‍රියාකිරීම ජාතියක් වශයෙන් අපගේ වගකීමයි. අපේ සියලු ජනතාව අතර විවිධත්වයේ සමගිය වර්ධනය කොට නව යුගයක් උදා කිරීමට හැකිවන පරිදි වාර්ගික අර්බුදයට විසඳුමක් සෙවීමට අවශ්‍ය ධෛර්ය හා පරිත්‍යාගශීලී ජීවගුණය අපට තිබිය යුතුය. ජනවර්ගය පදනම් කර ගනිමින් ප්‍රතිපත්ති සකස් කෙරෙන හා තීරණ ගන්නාවූ වර්ගවාදී දේශපාලනය අත්හැර දැමිය යුතුය. භාෂාව අඳහස් හුවමාරු කර ගන්නා මාධ්‍යයක් මිස ගැටුම් නිර්මාණය කරන්නාවූ දේශපාලන අවියක් ලෙස පාවිච්චි නොකළ යුතුය.

වාර්ගික අර්බුදයට විසඳුමක් සෙවීමේ හදිසි අවශ්‍යතාව පිළිබඳව ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක එකගත්වයකට එළඹීම අවශ්‍යය. සාකච්ඡාමය දේශපාලන විසඳුමක හදිසි අවශ්‍යතාව පිළිබඳව කිසිදු වාද විවාදයක් නැත. කලාපවලට බලය බෙදීම සහ මධ්‍යම ආණ්ඩුවේ බලය බෙදාහදා ගැනීම පිළිබඳ ප්‍රතිපත්ති සම්බන්ධයෙන්ද රාජ්‍යයේ ස්වභාවය සම්බන්ධයෙන්ද පුළුල් එකමතිකත්වයක් ඇත. ආණ්ඩුව හා එල්.ටී.ටී.ඊය අතර සංවාදය වර්ධනය කොට පවත්වාගෙනයාම සඳහා තුන්වන පාර්ශ්වීය උපකාරක රාජ්‍යයක අවශ්‍යතාව හඳුනාගෙන, බොහෝ බරපතළ විවේචන මධ්‍යයේ වුවත් ඒ සඳහා විධිවිධාන යෙදුවේ මාය.

ඉතාම පුළුල් ලෙස බලය බෙදාහරින වැඩ පිළිවෙලක් පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව යෝජනා කළේය. "1997 බලය බෙදීමේ යෝජනා" නමින් හැඳින්වුණු මෙම වැඩ පිළිවෙල මගින් රාජ්‍යය ව්‍යුහය සැළකිය යුතු ආකාරයකින් වෙනස් වන අතර වාර්ගික, භාෂාමය හා සංස්කෘතික භේදයකින් තොරව සියලු ජනතාව අතර සමාජ දේශපාලන සමානාත්මතාව වර්ධනය කිරීමට එය මංපාදයි. මෙම යෝජනා මාලාව සාකච්ඡා සහ කල්පවත්නා දේශපාලන විසඳුමක් සඳහා පිළිගත හැකි මනා පදනමක් සපයා දෙයි. අභිමානයෙන් යුතුව සාමකාමීව ජීවත්වීමට හැකි පරිසරයක් රට තුළ ඇතැයි යන විශ්වාසය දෙමළ ජනතාව තුළ තහවුරු කෙරෙන බලය බෙදාහැරීමේ වැඩ පිළිවෙලක් මගින් සන්නද්ධ අරගලය සම්පූර්ණයෙන්ම අනවශ්‍ය දෙයක් බව ඔවුන්ට එත්තුගැන්විය හැකි වන්නේය. සියලු ජාතීන් අතර සමගි සමාදානය ඇති කිරීමේ ජාතික කතිකාවතක් මම ආරම්භ කොට ඇත්තෙමි. සමාජයේ සෑම කොටස්වලටම බලපාන සියලු ප්‍රශ්න මෙහිදී පුළුල් ලෙස සාකච්ඡා කළහැකිය. එමගින් අද අපේ ජාතියට අවශ්‍ය සාමය හා සුවපත් කිරීමේ කාල පරිච්ඡේදය උදාකර ගතහැකි වන්නේය. අපේ ජාතික දේහයේ ඇති තුවාළ සුව කිරීමේ ක්‍රියාදමයේ කොටසක් වශයෙන් අතීතයේ අප මුහුණදුන් ඛේදජනක හා ශෝකජනක සිද්ධීන් මෙන්ම අපගේ අසාර්ථකත්වයන්ද අමතක කොට යථා තත්ත්වයට අවංකව මුහුණ දීමට අප ක්‍රියාකළ යුතුය. "වාර්ගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ ජනාධිපති සත්‍ය කොමිසම" පිහිට වූයේ මෙම කාරණය සිත්හි තබාගෙනය.

අපේ රටේ අනාගත ඉරණම සකස් කිරීමේ කාර්යයේ සහ දශක ගණනාවක් ඈතට දිවෙන වාර්ගික ගැටුමට විසඳුම් සෙවීමේ කාර්යයේ අප නිරතව සිටියදී, නිදහස, ආත්ම ගරුත්වය හා ප්‍රජාතන්ත්‍රය පිළිබඳ මූලික මානව හර වටිනාකම්වලට ගරු කිරීමටත්, සාමයෙන් සමගියෙන් හා ආරක්ෂා සහිතව ජීවත්වීමට සියලු ජනතාවන්ට ඇති අයිතිය ආරක්ෂා කොට පෝෂණය කිරීමටත් අප ක්‍රියාකළ යුතුය. අපේ රට තුළ ප්‍රජාතන්ත්‍රවාදී නොවූ ඒකාධිපති වාර්ගික ප්‍රාන්තයක් නිර්මාණය කිරීම සඳහා අපේ දේශයේ කොටසක් බෙදා වෙන්කර ගැනීමට අපට කිසිසේත් ඉඩදිය නොහැකිය.

අපේ රටේ කල්පවත්නා සාමයක් හා සමගියක් සහිත බහුවිධ සමාජයක් ගොඩනැගීම සහතික කිරීමට නම්, පුද්ගලයාගේ අයිතිවාසිකම් හා නිදහස ව්‍යවස්ථානුකූලව ආරක්ෂා කොට සහතික කරන්නාවූත්, සියල්ලන්ටම සමානාත්මතාවයෙන් සළකන සහ ප්‍රජාතන්ත්‍රය වර්ධනය කරන ප්‍රබල ප්‍රජාතන්ත්‍රවාදී ආයතන වලින් යුක්තවූත් නිදහස් සමාජයක් සහිත කලාපීය සංගම්වලින් සමන්විත නිදහස් ස්වෛරී, ස්වාධීන ජනරජයක් බවට අපේ රට පත්විය යුතුය.

සාමය හා සමගිය නියෝජනය කරමින්



# ජනතාවාදී ව්‍යවස්ථාවක්

පසුගිය කාලයේ ඇතිවූ සාකච්ඡා හා විවාද ගණනාවක විෂය බවට පත්වී තිබෙන්නේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවය. දේශපාලනඥයින්, ශාස්ත්‍රඥයින්, න්‍යායවේදීන් හා සාකච්ඡා මණ්ඩප හසුරුවන්නන් මේ පිළිබඳ සිය අදහස් ප්‍රසිද්ධියේ ගෙනහැර දක්වා තිබේ. විවාදයට තුඩුදුන් මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වනාහි 1977 දී හයෙන් පහක බලය ලබා ගනිමින් එක්සත් ජාතික පක්ෂය බලයට පත්වීමෙන් වසරකට පසු සම්මත කරනු ලැබූවකි. සුළු වශයෙන් හෝ සාකච්ඡාවකට බඳුන් කිරීමකින් තොරව එම ව්‍යවස්ථාව නීතියක් බවට පත් කිරීමට කටයුතු කරනු ලැබුවේ එබඳු වෙනසක් කිරීම සඳහා පෙර නොවූවිරූ ආකාරයේ ජනවරමක් මහජනතාව එක්සත් ජාතික පක්ෂයට ලබා දුන්නේය යන ස්වයං විශ්වාසය නිසා විය හැකිය. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන අංග ලක්ෂණ අතරින් එකක් වූයේ අප රට 1931 දී සර්වජන ඡන්ද බලය ලැබූ පටන් ක්‍රියාත්මක කරමින් තිබූ මැතිවරණ ක්‍රමය සම්පූර්ණයෙන්ම වෙනස් කරමින් නව මැතිවරණ පරිපාටියක් හඳුන්වාදීමය.

මේ ක්‍රමය හඳුන්වා දෙමින් මතුපිටින් කියා සිටියේ ඡන්දදායකයන් තෝරා ගන්නා විවිධ පක්ෂ සහ කණ්ඩායම්වල නියෝජනය එවායේ ප්‍රමාණය සමානුපාතික වන පරිදි පාර්ලිමේන්තුව තුළ තහවුරු කරණ බවය. සමානුපාතික නියෝජන ක්‍රමය තුළ එයටම ආවේනික යහපත් ලක්ෂණ තිබිය හැකිය. එහෙත් ලෝකය පුරා දේශපාලන විද්‍යාඥයින් තර්ක කරමින් පවසා ඇත්තේ සමානුපාතික නියෝජන ක්‍රමය අස්ථාවර හා වගකීම් විරහිත ආණ්ඩු නිර්මාණය කිරීමට තුඩුදෙන බවය. මේ අදහස ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්ද සත්‍ය බව ඔප්පු වී තිබේ. සමානුපාතික නියෝජනය ක්‍රියාත්මක කිරීමෙන් පසු ඇතිවූ සියලුම පාර්ලිමේන්තු දුර්වල එවා වූ අතර ඒ නිසාම අස්ථාවර ආණ්ඩු බිහිවිය. ආණ්ඩුව පරිපාලන කටයුතුවල නිරතව සිටිනවා මිස බලය පාවිච්චි නොකරන බව ඇතැමෙකුට පැවසිය හැකිය. එහෙත් එක දිගට බලයට පත්වූ විවිධ ආණ්ඩුවලට රටේ ඇවෙන ප්‍රශ්න විසඳලිය නොහැකිවූයේ මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිසාය. එසේම සමානුපාතික නියෝජන ක්‍රමය නිසා අපගේ අගනා සමාජ පැවැත්ම විනාශ වී ඇත. ඉතා විසකුරු අන්දමට පක්ෂ අභ්‍යන්තර ගැටුම් සහ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවල මට්ටම නොසිතූ විරූ ආකාරයකට වර්ධනය වී තිබේ.

අපට අවශ්‍ය වන්නේ සමාජ සාධාරණත්වය පිළිබඳ එක් පක්ෂයක දෘෂ්ටිය පමණක් ප්‍රවර්ධනය කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නොව ශ්‍රී ලංකාවේ සෑම දෙනාටම ගැලපෙන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි. ශ්‍රී ලංකාවට සුළුතර පකෂවල නියෝජිතයින්ද ප්‍රමාණවත් පරිදි සහතික කරන්නාවූ සමානුපාතික නියෝජන ක්‍රමයේ සහ වෙස්මිනිස්ටර් ක්‍රමය හෙවත් කේවල මන්ත්‍රී නියෝජන ක්‍රමය යන ක්‍රම දෙකේම සම්මිශ්‍රණයෙන් සැදුම්ලත් මැතිවරණ ක්‍රමයකි.

මා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත මේ කියන සියලුම ආකාරයේ ගැටලු සම්බන්ධයෙන් ඉතා පුළුල් ලෙස සාකච්ඡා කොට එළඹ ගන්නා ලද එකඟතාවන්ගෙන් පසුව සකස් කෙරුණු විසඳුම් වලින් සමන්විත විය. මේ පිළිබඳ දිවයින පුරා අනුවත් කිරීමේ වැඩසටහන්ද සම්මන්ත්‍රණයන්ද, මාධ්‍ය සාකච්ඡාද පැවැත්විණි. කෙටුම්පත පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව 77 වාරයක් රැස්වුණි. එසේම මාස පහක් පුරා සියලුම පිළිගත් දේශපාලන පක්ෂ එක්වී පුළුල් මට්ටමේ සාකච්ඡා පවත්වනු ලැබීය. මා මුලසුන දැරූ මෙම සාකච්ඡාවලට එවකට විපක්ෂ නායකවරයාව සිටි වත්මන් අග්‍රාමාත්‍යවරයාද සහභාගී විය. රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් කේ.එන්. චොක්සි මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මව්සිනුත්, පොදු පෙරමුණ විසිනුත් පිළිගනු ලැබිණ. කෙසේ වුවද 2000 අගෝස්තු 3 වැනිද කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේදී සියලු දෙනා විශ්මයට පත් කරමින් විරෝධතා තුළින් දේශපාලන වාසි ලබා ගැනීමේ පුරුද්ද ඉස්මතු විය. අප සියලු දෙනාටම පෙනී යන පරිදි දැනට ක්‍රියාත්මක වන මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස්කර තිබෙන්නේ අස්ථාවර පාර්ලිමේන්තුවන් හා අස්ථාවර විධායක ජනාධිපති ක්‍රමයක් නිර්මාණය කිරීමටය. මෙම දරුණු ව්‍යවස්ථාව නීතියක් බවට පත්වූයේ වෙස්ට්මින්ස්ටර් මැතිවරණ ක්‍රමය වූ කේවල මන්ත්‍රී නියෝජන ක්‍රමයෙන් ලැබූ බහුතර බලය උපයෝගී කර ගනිමින් සමානුපාතික නියෝජන ක්‍රමය (1978 ව්‍යවස්ථාවෙන් හඳුන්වාදුන්) යටතේ අනාගතයේ කිසිදු රජයකට තුනෙන් දෙකේ බහුතර බලයක් ලබාගත නොහැකි අන්දමටය. රට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා උගුලේ හිරකර යතුරු දමා ව්‍යවස්ථාවේ නිර්මාතෘන් උගුල ගලවන යතුර ඩීසිකර ඇති බව ඒ අනුව පැහැදිළිය. පාර්ලිමේන්තුව හා විධායක ජනාධිපතිවරයා එකිනෙකට වෙනස් මත දරණ දේශපාලන පක්ෂ වලින් පත්විය හැකි අවස්ථාවක් පිළිබඳ 1978 ව්‍යවස්ථාවේ නිර්මාතෘවරයා හෝ නිර්මාතෘවරුන් දුටුවේ නැත. එහෙත් එවැනි පත්වීම් සිදුවීමේ ඉඩකඩ පැවතුණි. අද එය යථාර්ථයක් වී ඇත.

දේශපාලනික වශයෙන් ගත් කල සහජීවනය යනු විශේෂ වූ කාර්ය භාරයන් ඉටු කිරීම සඳහා සන්ධාන ඇතිකර ගැනීමකින් තොරව ප්‍රධාන පක්ෂ සහයෝගයෙන් වැඩ කිරීමයි. එබඳු අවස්ථා නූතන දේශපාලනය තුළ මුළින්ම මතුවූයේ 1986 දී ප්‍රංශයේ පාර්ලිමේන්තුව හා ජනාධිපති අතර ගැටුමක් ඇතිවූ අවස්ථාවේදීය. ප්‍රංශයේ එම ඓතිහාසික සිදුවීම තුළින් ඇතිවූයේ ජැක්චිරාක් ජනාධිපතිවරයාට ලයනල් ජොෂ්පින්ගේ නායකත්වයෙන් වූ වාමාංශික පාර්ලිමේන්තුව සමග සහජීවනයෙන් කටයුතු කරන්නට සිදුවීමයි. ශ්‍රී ලංකාවේ ඇතැම් දේශපාලන පක්ෂ මෙම සහජීවනය බිඳදමා ජනාධිපති බලතල කප්පාදු කිරීම සඳහා ප්‍රයත්න දැරූ ආකාරයත්, එවා පරාජයට පත්වූ ආකාරයත්, පිළිබඳ දීර්ඝ වශයෙන් අදහස් දැක්වීමට මම බලාපොරොත්තු නොවෙමි.

මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොතරම් දෝෂ තිබුණද ශ්‍රී ලංකාවේ අපට මේ ව්‍යවස්ථාවට අනුගත වීම හැර වෙනත් විකල්පයක් අද ඉතිරිවී නැත. පටු දේශපාලන අරමුණු ඉෂ්ටකර ගැනීම උදෙසා මේ ව්‍යවස්ථාවට පැලැස්තර දැමීම

**2000 අගෝස්තුවේදී පාර්ලිමේන්තුව තුළ උද්යෝගිමත් ආයාචනයක් කරමින්**



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ප්‍රඥාවන්ත කාර්යයක් නොවේ. අද අවශ්‍ය වී තිබෙන්නේ වඩා ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීමයි. මා දිගින් දිගටම ප්‍රකාශ කර ඇති පරිදි මේ විධායක ජනාධිපති ධුරය දැරීම මට කිසිදු තෘප්තියක් ගෙන දෙන්නක් නොවේ.

මේ දරුණු ව්‍යවස්ථාවෙන් රට ගලවා ගැනීමට මම කැමැත්තෙමි. ජනතාව නැවත බල ගන්වන්නාවූද, නව මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දෙන්නාවූද අලුත් ව්‍යවස්ථාවක් අද අපට අවශ්‍යය.

*2001 දෙසැම්බර් - නව අගමැතිවරයෙකු හා රජයක් සමග සහජීවනය පතමින්*



# ජනතාවාදී ලෙන්ගතු පාලනය

"රටක සැබෑ සම්පත ජනතාවය." ආසියාවේ සාඩම්බර ස්ථානයක් අත්පත් කර ගන්නා ඉහළ සාක්ෂරතා මට්ටමක් සමග හැකියාවන් සහ බුද්ධිය වර්ධනය කරගත් ජනතාවක් හිමිවීමේ භාග්‍ය ලත් අප රට සම්බන්ධයෙන් මේ කියමන විශේෂයෙන් ගැලපේ.

එහෙත් ජනතාව ඔවුන්ගේ හැකියාවන්ගේ උපරිමයෙන් සන්නද්ධ කිරීම සඳහා වන "මානව සම්පත් සංවර්ධනය" නම් ක්‍රියාදාමයේ අභියෝගය හා කාර්ය සාධනය තවමත් නියමාකාර අවධානයකට ලක්වීද සම්පූර්ණවීද නැති හෙයින් එය මතුවටද අවධානයට ලක් කිරීමට හා මුහුණ දිය යුතු ක්ෂේත්‍රයකි.

රටක සංවර්ධනයෙහිලා මානව සම්පත් සංවර්ධන ප්‍රයත්නයන් හා උපාය මාර්ග වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි. මානව සම්පත් සංවර්ධනය යනු හුදෙක්ම ජාතික ආදායම ඉහළ දැමීම හෝ පහළ දැමීම පිළිබඳ කරුණක් නොවේ. එය ඵලදායිතාවයෙන් යුත් නිරෝගී ජීවිත පවත්වාගෙන යාමටත්, හැකියාවන් උපරිම ආකාරයෙන් විකසිත කර ගැනීමටත් ජනතාවට ඇති අවස්ථාවන් පුළුල් කරදෙන ක්‍රියාවලියකි. ඒ සඳහා යහපත් පරිසරයක් නිර්මාණය කර ගැනීමටද එයින් අවස්ථාව සැලසේ.

මානව සම්පත් සංවර්ධනය හා මානව හිමිකම් අතර ඇත්තේ එකිනෙකින් වෙන්කළ නොහැකි සම්බන්ධතාවකි. මානව නිදහස මේ දෙඅංශයේම පොදු දෘෂ්ටිය හා පොදු අරමුණය. අපේ රටේ ඉදිරි ගමනේදී ජනතාව රටේ සැබෑ සම්පත හෙයින් ජනතාව තුළ ආයෝජනය කිරීමට ප්‍රමුඛතාව ලබාදිය යුතුය.

## නූතන අභියෝගයට මුහුණ දෙන අධ්‍යාපන පෙරළිය

සෑම දෙනාටම සම අවස්ථා සලසා දීමට යත්න දරමින් විශිෂ්ට අධ්‍යාපනයකට මංපෑදීම අධ්‍යාපන ක්ෂේත්‍රයේ අපේ දර්ශනයයි. නූතන ඉතිහාසයේ නොවූවිරූ ආකාරයකට ප්‍රාථමික, ද්විතීයක හා තෘතීයික අංශ ඇතුළත් කර ගනිමින් දූරදර්ශී අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් 1998 සිට ක්‍රියාත්මක විය. ජනතාවගේ සුභසෙත, අභිමානය ආරක්ෂාව සහතික කිරීම මෙහිදී ප්‍රධාන වන්නේය. මූලික පහසුකම් හා රැකවරණය සහිත සතුටුදායක ජීවන රටාවක් සලසාදීම මෙහිදී පළමු අවශ්‍යතාවයි.

මේ ප්‍රතිසංස්කරණ වල ඉදිරි දැක්ම වූයේ 21 වන සියවසේ ගෝලීය සමාජ ආර්ථික ක්ෂේත්‍රයේ සිදුවන්නාවූ ශීඝ්‍ර වෙනස්කම්වලට මුහුණදීමට හැකිවන අයුරින් අනවශ්‍ය දැනුමෙන්, හැකියාවන්ගෙන් හා ආකල්ප වලින් අපගේ ළමා පරපුරට සන්නද්ධ කෙරෙන අපේ අධ්‍යාපන ක්‍රමය විප්ලවීය පරිවර්තනයකට හා නවීකරණයකට ලක් කිරීමය. අපේ ප්‍රතිපත්තිය යොමුවී තිබුණේ ගෝලීය වෙනස්කම් වලට අනුකූලවන්නාවූ නිර්මාණාත්මක දිශාවකටය. එසේම එය ඉදිරි දශකයේදී අපේ රට උදකර ගැනීමට අපේක්ෂා කරන්නාවූ දැනුම හා තොරතුරු තාක්ෂණය ලද්දනම් කරගත් සමාජයේ කොඳුනාරටිය වන ළමා පරපුරක් හැඩගස්වා ගැනීමට කෙරෙහි යොමු වී තිබුණි.



බාල පරපුර දිරිමත් කරමින්

පාසල්වලට හා විශ්ව විද්‍යාල පද්ධතීන්ට හඳුන්වාදුන් ශිෂ්‍ය කේන්ද්‍රීය හා ක්‍රියාකාරකම් මූලික විෂය මාලා ප්‍රතිසංස්කරණවල අරමුණ වූයේ යොවුන් පරපුරේ පරිකල්පන ශක්තීන් ප්‍රබෝධමත් කිරීම, ඔවුන්ගේ කුතුහලයන් අවදි කිරීම, ගැටුම් නිරාකරණය කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම හා අද පවතින සමාජයේ විවිධාකාර අභියෝගයන්ට මුහුණදීමේ හැකියාවන් ඔවුන් තුළ කාවැද්දීමය. තරගය මත පදනම් වූ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් ප්‍රවීණත්වය පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමයකට පරිවර්තනය කිරීම සුවිශේෂ වූ පරිවර්තනයකි.

නව පාඨ ග්‍රන්ථ හා නවීන ගුරු පුහුණු විධික්‍රම පද්ධතීන්ගේ සහාය ලබා ගනිමින් බිහිවූ අලුත් ඉගැන්වීමේ ක්‍රම ඔස්සේ හඳුන්වාදුන් නව විෂය මාලාවන් සම්බන්ධීකරණය කළේ 1997 දී පාර්ලිමේන්තු පණතක් මගින් පිහිටුවනු ලැබූ ජාතික ගුරු අධ්‍යාපන අධිකාරියයි. අභිනවයෙන් පිහිටුවන ලැබූ ජාතික ඇගයීම් හා විභාග සේවා දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිව්‍යුහගත කරනු ලැබූ විභාග හා පාසල් මට්ටමේ ඇගයීම් ක්‍රියාත්මක කරනු ලැබිණි. 1998 දී අනිවාර්ය අධ්‍යාපන පණත හඳුන්වාදීමෙන් ප්‍රාථමික හා ද්විතීයික පාසල්වලට සිසුන් බඳවා ගැනීම වඩාත් තහවුරු කෙරිණි. ගුරුවරුන්ගේ හා විදුහල්පතිවරුන්ගේ වෘත්තීය හැකියාවන් දියුණු කිරීම, නායකයන් හා කළමනාකරුවන් බවට පත්වීමට හැකිවන පරිදි ඔවුන් සවිබල ගැන්වීම, වැඩි දියුණු කිරීම හා වඩා යහපත් පාඨශාලා පාලනයක් සඳහා පාසල් මූලික කළමනාකරණය හඳුන්වාදුන් අනෙකුත් ප්‍රධාන අංගයන්ය.

වර්තමානයේ ප්‍රධාන අභියෝගය වන්නේ දැනට ක්‍රියාත්මක වන සිංහල හා දෙමළ ඉගැන්වීම් වැඩිදියුණු කරමින්ම ඉංග්‍රීසි ඉගැන්වීම ශක්තිමත් කිරීමය. සමහර පන්තිවලට වෛකල්පික ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපනයක් ලබාදීම සඳහා පසුගිය වසරේදී හඳුන්වාදුන් අවස්ථාව ඉදිරියේදී ක්‍රමයෙන් පුළුල් හා ශක්තිමත් වනු ඇත. සියලුම පන්ති සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වාදීමට නියමිතය.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

අධ්‍යාපනය ප්‍රතිසංස්කරණ තුළින් යෝජනා වූ තොරතුරු තාක්ෂණය විෂය මාලාවට අන්තර්ගත විෂයයක් ලෙස හඳුන්වාදීම ඉදිරියේ සාර්ථකව ක්‍රියාත්මක වනු ඇත. ජ්‍යෙෂ්ඨ පාසල්වල විද්‍යා හා ගණිතය ඉගෙන ගැනීමේ අවස්ථාවන් පුළුල් කිරීම සඳහා පසුගිය වසරේදී සකස් කරනු ලැබූ වැඩසටහන ඉදිරියේදී තවදුරටත් සංවර්ධනය කර ක්‍රියාත්මක කරනු ඇත.

නවෝද්‍යා වැඩපිළිවෙල මාර්ගයෙන් ග්‍රාමීය පාසල් නවීකරණය කිරීම සඳහා ආරම්භ කළ විශේෂ වැඩසටහන් (උදාහරණ - සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයකින්ම තෝරාගත් පාසලක් සංවර්ධනය කිරීම) කඩිනමින් හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ යුතුව තිබේ. කන්නගගර මධ්‍ය මහා විද්‍යාල, වතුකරයේ පාසල් හා උතුරු නැගෙනහිර පාසල් වැඩිදියුණු කිරීම මේ වැඩ පිළිවෙලට අයත්ය.

පළමුවන ශ්‍රේණියේ පෝෂණ වැඩසටහන, ජ්‍යෙෂ්ඨ පාසල් සිසුන් සඳහා උපදේශන හා නියාමක සේවා ලබාදීම, අපහසුතාවන්ට ලක්වූවන් සඳහාවූ ශිෂ්‍යත්ව ව්‍යාපෘතීන්, නොමිලයේ දෙන පාසල් පොත් හා නිල ඇඳුම් බෙදදීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම යනාදී වශයෙන්වූ විශාල පරාසයක අන්තර්ගත වන පරිදි හඳුන්වාදුන් සුභසාධන වැඩසටහන් තවදුරටත් පුළුල් කර කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ යුතුව තිබේ.

## ඉදිරිමග හා 2002 න් ඔබ්බට

- පසුගිය වසරේ ආරම්භ කරන ලද සමගි පන්ති කාමර සහ සමගි පාසල් පිහිටුවීම වැනි විවිධාකාරවූ නව ක්‍රියාමාර්ග ඔස්සේ පාසල් මට්ටමින් ජාතික ඒකාබද්ධතාව ශක්තිමත් කිරීම.
- ආබාධිත වූවන්ගේ අධ්‍යාපනය සඳහා නව වැඩසටහන හඳුන්වාදීම.
- පළාත්, දිස්ත්‍රික් හා කලාපීය මට්ටමින් යථා පරිදි සකස් කරන ලද පුස්තකාල පහසුකම් ලබාදීම සහ ප්‍රකාශන කර්මාන්තය වැඩිදියුණු කිරීම මගින් අධ්‍යාපනික වැදගත්කමින් යුත් පොත පත පහසුවෙන් ලබාගැනීම යනාදී ක්‍රියාමාර්ග හරහා කියවීමේ පුරුදු වැඩි දියුණු කිරීම.
- පාසල් හැරයන්නවුන් විශේෂ අවධානයකට ලක්කරමින් විවෘත හා දුරස්ථ අධ්‍යාපනයට අදාළ නව ප්‍රතිපත්ති හා වැඩසටහන් හඳුන්වාදීම.
- 1939 අධ්‍යාපනය ආඥා පණත සංශෝධනය කිරීම. එම සංශෝධන පහත සඳහන් අංශ කෙරෙහි යොමු වනු ඇත.

- පාසල් කළමනාකරණ සභාවලට පැහැදිලි බලතල ලබාදීම, එවා ස්වාධීන ආයතන බවට පත් කිරීම, යහපත් පරිපාලනය හා පාසල් තුළ විනය තහවුරු කිරීම.
- ප්‍රමිති හා තත්ත්ව සහතික කිරීමේ ක්‍රම පද්ධති ආයතන ගත කිරීම. රාජ්‍ය හා පුද්ගලික පාසල් පද්ධතීන්වලට නිසි පිළිගැනීම් ක්‍රම ඇති කිරීම.



*1999 - අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ අදහස් විමසමින්*

- පෙර පාසල්, ළමා සුරැකුම් හා සංවර්ධනය පිළිබඳ සකස් කර තිබෙන ප්‍රතිපත්ති නීතිගත කිරීම.
- නව පාසල් ඇතුළත්වීමේ ප්‍රතිපත්ති හා නව විශ්ව විද්‍යාල ප්‍රවේශ ක්‍රමයක් හඳුන්වාදීම.
- ඉගෙන ගැනීමේ මාධ්‍ය තෝරා ගැනීම හා විභාගවලට පෙනී සිටීමේදී සිසුන්ට අවස්ථාවන් සලසාදීම.

මූලික පෙර පාසල්, ප්‍රාථමික හා ද්විතීයික පාසල්වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමෙන්ද, වසර හතරකට පෙර හඳුන්වාදුන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් සමස්ත පාසල් ව්‍යුහයම නවීකරණය කිරීමෙන්ද බලාපොරොත්තු වන්නේ නව සමාජ ආර්ථික පර්යාය තුළ වෙනස්වීමට භාජනය වන්නාවූ සේවා නියුක්ති රටාවන් කෙරෙන් ජනිතවන හැකියාවන් පිළිබඳ ඉල්ලීම්වලට යථා පරිදි අනුගත වීමට පාසල හැරයන තරුණ තරුණියන් සමත්වනු ඇතය යන්නය.

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා කැපී පෙනෙන ප්‍රතිසංස්කරණ යෝජනා කර තිබේ. එවා පහත සඳහා අංශ කෙරෙහි යොමුවී ඇත.

- රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධති පුළුල් කිරීම. එවාට ලබාදෙන මූල්‍ය හා අනිකුත් පහසුකම් වැඩිකිරීම.
- විෂය මාලා හා පාඨමාලා විවිධාංගීකරණයට ලක් කිරීම. පාඨමාලා එකක විෂය නිර්දේශවලට අන්තර් පීඨ සම්බන්ධීකරණයක් හඳුන්වාදීම.
- අධ්‍යයන විෂය ධාරාවන් තෝරාගැනීමේදී නිදහස හා නම්‍යශීලී භාවය තහවුරු කිරීම.
- පුද්ගලික අංශය හා කර්මාන්ත අංශය සමග විධිමත් ආයතනික සම්බන්ධතා ඇති කිරීම.

උපදේශන සේවාවන්, මෙහෙයවීම් සේවාවන් ලබාදීම.

නව පරිපාලන ක්‍රම - විශ්ව විද්‍යාලවලට හා උපකුලපතිවරුන්ට ස්වාධීනත්වය ලබාදීම.

කාලීන ගෝලීය රැකියා වෙළඳ පොලේ අවශ්‍යතාවන්ට මුහුණ දිය හැකිවන ආකාරයට විශ්ව විද්‍යාල පණත සංශෝධනය කිරීම.

ආචාර්ය මණ්ඩල වැඩිදියුණු කිරීම සහ කාර්ය සාධන ඇගයීම්.

මේ ආකාරයට වසර තුනකට පෙරදී හඳුන්වාදුන් වෙනස්කම් ඉදිරියේදී වඩාත් ශක්තිමත් කළ යුතුව තිබේ.

විශ්ව විද්‍යාලවලට පූර්ණ ස්වාධීනත්වයක් ලබාදෙන සහ ප්‍රමිති හා ගුණාත්මක තත්ත්ව සහතික කිරීම හඳුන්වා දෙමින් විශ්ව විද්‍යාල පණත කඩිනමින් සංශෝධනය කරන අතර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම හරහා විශ්ව විද්‍යාලවල නිල පිළිගැනීමේ තත්ත්වයන් ලබාදීමට නියමිතය.

පාසල් හැරයන්නවුන්ට ගුණාත්මක වශයෙන් දියුණුවූ උසස් අධ්‍යාපනයට හා පුහුණුවට අවකාශ ලැබෙන පරිදි අතිරේක අවස්ථාවක් සල්සාදීමේ අරමුණින් පෞද්ගලික අංශය සමග සහභාගිත්වයක් ගොඩනගාගැනීම සඳහා ඵලදායී ප්‍රයත්නයක්ද දරනු ලැබේ. ඒ අතුරින් තෘතීයික මට්ටමට අදළ වැඩ සටහන් පිළිගත හැකි තත්ත්වයේ උපාධි පිරිනමන ආයතන හා අනාගතයේදී පිහිටුවන නව විශ්ව විද්‍යාල අනුසාරයෙන් ක්‍රියාත්මක වනු ඇත. මේ වැඩසටහන් ජාතික අවශ්‍යතාවන් හා ජාත්‍යන්තර තලයේ පැන නගින නව සේවා නියුක්ති රටාවන්ට අනුගත වන පරිදි විද්‍යාව, තාක්ෂණය හා තොරතුරු තාක්ෂණ යන විෂයයන්හි නව වර්ධනයට අනුකූලවූ විෂයයන් කෙරෙහි යොමුවනු ඇත.

ආයතනික විධික්‍රම ඔස්සේ ජීවන කුසලතා චර්යා විද්‍යාවන් සහ ප්‍රජාහැඟීම් යන විෂයයන් කෙරෙහි අවධානය යොමු කරමින් විෂය මාලා වෙනස් කෙරෙනු ඇත.

වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව සහ වෙනස්වන ශ්‍රම වෙළඳපොල අවශ්‍යතාවන් අතර වඩා අර්ථාන්විත සංයෝගයන් සාක්ෂාත් කළ යුතුව තිබේ.

රැකියා සම්පාදනයෙහිලා ප්‍රධාන යාන්ත්‍රණය වශයෙන් පුද්ගලික අංශය ඉදිරියටද පවතිනු ඇත. ඒ අනුව තෘතීයික මට්ටමේ වෘත්තීය පුහුණු කිරීම් ආයතන ගත කිරීම සඳහා පුද්ගලික අංශය දිරිගන්වනු ලැබේ. පුද්ගලික අංශය මෙසේ ප්‍රධාන රැකියා සම්පාදකයා සහ රැකියා ප්‍රවේශ පුහුණු කරන්නා ලෙස දිරි ගැන්වෙද්දී රජය පහසුකම් සලසන්නා හා සැලසුම් කරන්නා හා ප්‍රමිති හා තත්ත්ව නිර්ණය කරන්නා ලෙස කටයුතු කරනු ඇත. ප්‍රාථමික, ද්විතීයක හා තෘතීයික අංශවල දැනට ක්‍රියාත්මක වන නිදහස් අධ්‍යාපනය ජාතික අයවැයෙන් ලබා දෙන්නා වූ මූල්‍ය ප්‍රතිපාදන සමග ආරක්ෂාකර ශක්තිමත් කෙරෙනු ඇත.

යහපත් ගුණාත්මක අධ්‍යාපනයකට අවකාශ සලසන්නාවූද, නිර්මාණාත්මක හැකියාවන් දිරිගන්වන්නාවූද, උසස් හා නූතන මාදිලියේ ශක්‍යතාවන් සංවර්ධනය කරන්නාවූද අපේ තරුණ පරපුරේ නිර්මාණශීලිත්වය විකසිත කරන්නාවූද මේ ප්‍රතිපත්ති කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම අනාගත අධ්‍යාපන සංවර්ධනයේ මුල්ගල වනු ඇත.

## කරුණාව හා දයාව පෙරදැරි කරගත් විශිෂ්ට සෞඛ්‍ය සේවාවක්

අපේ රට හා සමාන ආදයම් මට්ටමක් ඇති අනිකුත් රටවල් හා සසඳා බලන කල ශ්‍රී ලංකාවේ යහපත් සෞඛ්‍ය දර්ශකයන් දක්නට හැකි වුවද වර්ධනය වෙමින් පවතින ජන ව්‍යාප්ති රටාවන් සහ අනිකුත් වෙනස්කම් නිසා අපේ රටේ ජනතාව ගොදුරු කර ගන්නා රෝග පීඩා පැතිරයාමේ නව තත්ත්වයන් මතුවී තිබේ. එසේම පිළිකා, දියවැඩියාව, හෘද රෝග ස්වාසනාබාධ වැනි රෝගද අතිශය දරුණු ඔත්පලවීම හා මරණය ගෙනදෙන ඒවා වන ආකාරයටම මතුවී තිබේ.

රාජ්‍ය අංශයේ රෝහල්වල පවත්නා තදබදය, ශල්‍යකර්ම සඳහා ලැයිස්තුවලට ඇතුළත්ව දිගු කලක් බලාසිටීමට සිදුවීම, අකාර්යක්ෂම විශේෂඥ උපදේශක සේවා සහ මූලික චිකිත්සාවන් සඳහා අත්‍යවශ්‍ය පහසුකම් හිඟවීම යනාදිය හේතු කොටගෙන පුද්ගලික බටහිර හා ආයුර්වේද වෛද්‍ය සේවාවන්හි පිහිට පැතීමට රෝගීහු පෙළඹී සිටිති.

මේ සියලු කරුණු සැළකිල්ලට ගනිමින් 1998 දී යෝජනා කරනු ලැබූ සෞඛ්‍ය ප්‍රතිසංස්කරණ මගින් ප්‍රජා සෞඛ්‍ය අවශ්‍යතාවන් හඳුනාගැනීම හා ඒවාට ප්‍රමුඛත්වයක් දීම, පළාත් අධිකාරීන්ට අවශ්‍ය බලතල පවරා දෙමින් රජයේ රෝහල් අංශය සංවිධානය කිරීම හා කළමනාකරණය කිරීම, සෞඛ්‍ය අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම, විවිධාකාරයේ ආදයම් උපයන මාර්ග ඔස්සේ සෞඛ්‍ය සඳහාවූ මානව හා අනිකුත් සම්පත් උපයෝජනය හා සෞඛ්‍ය අංශයේ වෘත්තිකයන්ගේ කාර්ය සාධනය දියුණු කිරීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ලැබිණි.

මේ යෝජනා ක්‍රියාත්මක කිරීමට අමතරව උසස් ගණයේ පුද්ගලික අංශයේ ආයෝජනයන් දිරිමත් කරමින් රට පුරා ද්විතීයික හා තෘතීයික මට්ටමේ



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

පුද්ගලික රෝහල් ආරම්භ කිරීමේ වැඩසටහන් සකස් කෙරුණි.

පුද්ගලික අංශයේ සියලු සෞඛ්‍ය ආයතන සඳහා නියාමක ක්‍රම හා ප්‍රමිති පවත්වාගෙන යාම සඳහා විධිවිධාන යොදනු ලැබේ. යථා පරිදි සැලසුම් කරනු ලබන සෞඛ්‍ය රක්ෂණ වැඩසටහන් සමග පුද්ගලික හා රාජ්‍ය අංශයේ මිශ්‍ර දායකත්වයෙන් හා අන්තර් සහනාධාර ක්‍රමවලින් යුක්ත උසස් සෞඛ්‍ය සේවා ආයතන පිහිටුවීමට නියමිතය.

පාසල් මට්ටමේ පෝෂණ වැඩසටහන් හා මාතෘ හා දරක චිකිත්සා සායන ආශ්‍රිත ක්ෂේත්‍ර මට්ටමින් ළමුන්ගේ හා ගැබිණි මව්වරුන්ගේ පෝෂණ තත්ත්වයන් දියුණු කෙරෙනු ඇත. පෘථුල සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන්වල ආධාරයෙන් හා ප්‍රාථමික නිවාරණ උපක්‍රම මගින් බෝවන රෝග අවම කිරීමට කටයුතු කෙරෙනු ඇත. මැලේරියාව, ඩෙංගු වැනි රෝග වලින් සම්පූර්ණයෙන්ම නිදහස් වීමට විශේෂ අවධානයක් යොමු කෙරෙනු ඇත. සාර්ථක වී ඇති පුළුල් කරන ලද ප්‍රතිශක්තිකරණ වැඩසටහන ශක්තිමත් කොට දියුණු කරනු ලැබේ.

පර්යේෂණ හා සංවර්ධන කටයුතු මගින් ඖෂධීය පැළෑටි පදනම් කරගත් වෛද්‍ය ක්‍රම නංවාලමින් සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයුර්වේද වෛද්‍ය පහසුකම් වැඩිදියුණු කරමින් දේශීය වෛද්‍ය ක්‍රමය නංවාලීමට පුළුල් ඉඩ ප්‍රස්ථා සලසා දෙනු ලැබේ. මානසික හා කායික ආබාධවලින් පෙළෙන අය සහ ශීඝ්‍රයෙන් වැඩිවන වැඩිහිටි ජනගහණය වැනි වරප්‍රසාද රහිත කොටස් සඳහා උපරිම සෞඛ්‍ය රැකවරණය ලබාදෙන අතර, ළමා රෝග පිළිබඳ දියුණු හා විශේෂඥ සේවා මධ්‍යස්ථාන මගින් ළමා සෞඛ්‍ය සේවා වැඩිදියුණු කෙරේ.

අප රටේ මෙන්ම කලාපයේ අනිකුත් රටවල ජනතාවටද පහසුකම් සලසන මට්ටමේ දියුණු සෞඛ්‍ය සේවාවන් සැපයිය හැකි විශිෂ්ට ගණයේ ආයතන පිහිටුවීම හැම අතින්ම දිරිගන්වනු ලැබේ. කරුණාව, දයාව හා සැළකිල්ල පෙරදැරි කරගත් විශිෂ්ට හා සමාන සේවාවන් සපයන නවීන ක්‍රම වලින් සමන්විත සෞඛ්‍ය අංශයක් ගොඩනැගීම අපගේ ඉදිරි දර්ශනයයි.

## කාන්තාවන් සහ ළමුන්

සැලකිය යුතු තරමේ ඉහළ මට්ටමක පවතින කාන්තාවන්ගේ ආයුකාලය, පහළ මට්ටමේ පවතින මාතෘ හා ළදරු මරණ අනුපාතය, ඉහළ අගයකින් යුක්ත කාන්තා සාක්ෂරතාවය, පාසල් යන ගැහැණු ළමුන්ගේ සංඛ්‍යාව, සතුටුදායක මට්ටමක පවතින කාන්තා සේවා නියුක්තිය යන කරුණු අප රටේ කානාතාවන්ට ලබා ඇති ජයග්‍රහණ කිහිපයකි. දණ්ඩ නීති සංග්‍රහයට අත්‍යවශ්‍ය සංශෝධන එක් කරමින් පණතක් ඉදිරිපත් කර කාන්තා අයිතීන් නැවත බලගැන්වීම හා කාන්තාවන් ප්‍රචණ්ඩත්වයෙන් හා අපයෝජනයෙන් බේරා ගැනීමේ විධිවිධාන හඳුන්වා දෙන ලදී.

අංශ දෙකකට සම්බන්ධවී එනම් විදේශ රැකියාවන්හි නියුක්ත කාන්තාවන් හා අපනයන ප්‍රවර්ධන කලාපවල වැඩකරන කාන්තාවන්ගේ ආරක්‍ෂාව, සෞඛ්‍ය හා සුභසාධනය තහවුරු කිරීමේ නව ක්‍රියාමාර්ග ඉතා මෑතකදී ගනු ලැබිණි.

විශේෂ ජනාධිපති කාර්යසාධන බලකාය මගින් ආරම්භ කරණ ලද ක්‍රියාකාරකම් තුළින් ඉහත කී කාන්තාවන්ට අත්‍යවශ්‍ය තොරතුරු ලබාදීම, මතුවන සියලුම තත්ත්වයන්ම සමග ගනුදෙනු කළ හැකි වන ආකාරයට අවශ්‍ය දැනුම හා හැකියාවන් ප්‍රවර්ධනය ආදී වැඩසටහන් නිසි පරිදි ආයතන ගත කෙරිණි.

කාන්තාවන්ගේ සෞඛ්‍ය පෝෂණය, මානසික හා සාමාජික යහපැවැත්ම ඉඳුම් හිටුම් හා ආරක්‍ෂාව, ආයෝජන ප්‍රවර්ධන කලාපවල ඇගළුම් හා අනිකුත් කර්මාන්තවල සේවාවන්හි නිරතවීමේදී මතුවන අනිකුත් අභියෝග හා ගෘහස්ථ හා විදේශ සේවා නියුක්තියේදී මතුවන ගැටලු යනාදියට අදාළ විවිධ අංශ පිළිබඳ අවධානය යොමු විය.

මෙම වැඩසටහන් ශක්තිමත් කිරීමට අමතරව වතුකරයේ කම්කරු කාන්තාවන්ගේ සෞඛ්‍ය, පෝෂණය යහපැවැත්ම විශේෂයෙන් ඉලක්ක කර ගත් වැඩසටහන් හඳුනා ගනිමින් ක්‍රියාත්මක කෙරිණි.

ළමුන් සම්බන්ධයෙන් සංවේදී වීම (උදහරණ - ළමුන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය හා ආරක්‍ෂාව හා ක්ෂේත්‍රවල ආයෝජනය කිරීම) අද දවසේ දියුණු රටවල හා දියුණු වෙමින් පවත්නා රටවල ප්‍රමුඛතාවට ලක් වී ඇති කරුණකි. ළමුන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ගන්නාවූ දැනටත් සඳහන් කර ඇති පියවර හැරුණු විට ළමුන් ප්‍රචණ්ඩත්වයෙන්, ලිංගික හා කායික අපයෝජනයන්ගෙන් ළමා ශ්‍රම යෝජනයෙන් පාසල් මට්ටමේ කෲර දඩුවම් වලින් ආරක්‍ෂා කිරීම සඳහා විශේෂ ප්‍රයත්න දරා තිබේ. 1997 දී ප්‍රතිෂ්ඨාපනයවූ ජාතික ළමා ආරක්‍ෂණ අධිකාරිය මගින්ද හඳුන්වාදෙනු ලැබූ විවිධ නීතිමය ක්‍රමෝපායන් මගින්ද ළමුන් උදෙසා ලබාදුන් ප්‍රමුඛතාව පැහැදිලිව ප්‍රකාශ වී තිබේ.

මත්පැන්, දුම්වැටි, හා විෂ මත්ද්‍රව්‍ය වලින් ළමුන් බේරා ගැනීම බරපතළ ලෙස අවධානයට ලක්වූ කරුණක් විය. මතින් තොර පාසල් හා මතින් තොර සමාජයක් බිහි කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අපි දැනටමත් ආරම්භ කර අත්තෙමු. මත්ද්‍රව්‍ය, ප්‍රචණ්ඩත්වය, අසභ්‍ය ප්‍රකාශන, ලිංගික සූරාකෑම, ළමා ශ්‍රමය, ළමා අපයෝජනය යනාදී දුර්ගුණාංග වලින් තොර සමාජයක් සාක්ෂාත් කිරීම අපගේ ඉලක්කයයි.

## අසරණවූවන්ට සරණ

සමාජයේ අසරණ භාවයට පත්ව සිටින්නාවූ විශේෂයෙන් රැකබලා ගතයුතු කණ්ඩායම්වල වුවමනාවන් ඉටු කිරීම විශේෂ අවධානයකට ලක්විය යුත්තකි. මේ අය අතර ආබාධිතවූවන්, අනාථවූවන්, දුබලතාවන්ට ලක්වූවන් යුද්ධය හා ත්‍රස්තවාදය නිසා කායික හා මානසික කම්පනයට ලක්වූවන්, වාසස්ථාන අහිමිවූවන් හා වීදි දරුවෝද සිටිති.

සියලුම ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවර්ධනය කළ යුත්තේ අප රටේ මෙකී දුර්භාග්‍යයන්ට මුහුණදුන් ජන කොටස් කෙරෙහි අවධානය යොමු කරමින්ය. තම මව්බිමේ ආරක්‍ෂාව උදෙසා ආත්මාර්ථකාමිත්වයෙන් තොරව වටිනා ජීවිත පරිත්‍යාග කළ වූවන් රැකබලා ගැනීම සඳහා පිහිටවූ රණවිරු සේවා අධිකාරිය

අසරණභාවය පත්වූ ජන කොටසක් ඉලක්ක කර ගනිමින් කැපී පෙනෙන සේවයක් ඉටු කරණ ආයතනයකි. එයින් සිදුවන්නේ ආරක්ෂක හමුද සෙබළුන්ගේ හා ඔවුන්ගේ දරු පවුල්වල අවශ්‍යතාවන් ඉටු කිරීම පමණක් නොවේ. යුද්ධයෙන් හා ත්‍රස්තවාදය නිසා ආබාධිත භාවයට පත්වූ ආරක්ෂක හමුද සෙබළුන්ගේ හැකියාවන් ඔප් නැංවීමේ වැඩසටහන්ද එමගින් ක්‍රියාත්මක කරණු ලැබේ. දීර්ඝ කාලයක් තිස්සේ ඇදී යන යුද්ධය හා ත්‍රස්තවාදය නිසා මානසික කම්පනයට ලක්වූවන් සඳහා අවශ්‍ය උපදේශන සේවාවන්ද එමගින් ක්‍රියාත්මක කරනු ලැබේ.

*2000 ජූලි - රණවිරු සේවා හමුවකදී දුක සැප විමසමින්*



*ජනතාවාදී ලෙන්ගතු පාලනය*

# ජනතා හිතවාදී වෙළඳ පොල ආර්ථිකය

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සම්බන්ධයෙන් අපගේ ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති රාමුව 1994 දි මා පාලන බලය භාරගත් පසුපසු ප්‍රථම වතාවට ඉතා පැහැදිලිව ප්‍රකාශයට පත්විය.

එම ප්‍රතිපත්ති රාමුව තුළ මාගේ පාලන කාලය තුළ ඉදිරිපත්වූ අනුක්‍රමික අයවැය ලේඛණ හතක් ආශ්‍රිතව එකී ප්‍රතිපත්ති තවදුරටත් විග්‍රහවූ අතර ප්‍රායෝගික ක්‍රියාමාර්ග බවට පරිවර්තනය විය. විශේෂයෙන් සෝවියට් සංගමය, නැගෙනහිර යුරෝපය, චීනය වැනි රටවල සිදුවූ ආර්ථික වෙනස්කම් ඇතුළු ලෝකය පුරා ආර්ථික පර්යායයේ සිදුවූ වෙනස්කම් පිළිබඳව අපි හොඳින් දැනුවත්ව සිටියෙමු. ශීඝ්‍ර වෙනස්කම්වලට ලක්වන්නාවූ ගෝලීය ආර්ථිකය තුළ අප වැනි කුඩා රටකට හුදකලාවී සිටිය නොහැකි බවට පැහැදිළි එකගතාවක්ද තිබිණි.

අප රට සම්බන්ධයෙන් බලන කල ආසන්න වශයෙන් දශක දෙකක් පුරා එවකට තිබූ රජය ක්‍රියාත්මක කළ නිදහස් වෙළඳ පොල ආර්ථික ප්‍රතිපත්ති යම් යම් අංශ දියුණු කිරීමට දක්වන ලද අසමත් බව අපි දුටුවෙමු. අධ්‍යාපනය, සෞඛ්‍ය, පරිසරය, ග්‍රාමීය හා සුළු පරිමාණ නිෂ්පාදන අංශය, සමාජ හා සංස්කෘතික සංවර්ධනය, දිළිඳු සහ රැකියාවිරහිතයන්ගේ ආරක්‍ෂාව සහතික කිරීම මේ අංශ අතර ප්‍රධාන වේ.

මේ පසුබිම යටතේ අපගේ අභියෝගය වූයේ මිනිසත් බව අගයන, ජනතා හිතවාදී රජයකින් යුක්ත වන්නාවූ නවීන ආර්ථිකයක් තරගකාරී වෙළඳ පොල ආකෘතිය තුළ ගොඩනැගීමය. අපගේ සංවර්ධන ඉලක්ක වූයේ ඉහළ මට්ටමේ ආයෝජන හා කාර්යක්‍ෂම භාවයේ හා ඵලදයීතාවේ සහ සාධනයන් මගින් සියයට 7 සිට සියයට 8 දක්වා වූ ආර්ථික වර්ධනයක් පවත්වාගෙන යා හැකි ශක්තිමත් නවීන ආර්ථිකයක් ගොඩනැගීමය. රජය සමග ඉතා සුහදශීලී සම්බන්ධතා පවත්වාගෙන යන්නාවූ සම්ප්‍රදායන් සහිත තරගකාරී වෙළඳ පොල ව්‍යුහය තුළ ක්‍රියාත්මක වන විවිධ ගතිකයන්ගෙන් යුත් පුද්ගලික අංශයක් නොනැගීම එම ඉලක්කයට අන්තර්ගත විය. මේ සඳහා ගනු ලැබූ රේගු බදු අඩු කිරීම, බදු සහන, බදු සහනදීම යථාවත් කිරීම නියාමක කටයුතු විධිමත් කිරීම යනාදී ක්‍රියාමාර්ග නිසා ජනතාවට උපරිම ප්‍රයෝජන අත්වූ අතර නාස්තිය හා දූෂණය දුරු කිරීමට හැකිවිය.

ඒ වනවිට ඉතා නොසැළකිල්ලෙන් ක්‍රියාත්මක කරමින් තිබූ පුද්ගලිකකරණ වැඩ පිළිවෙල විධිමත් කෙරුණි. එමගින් අපේක්‍ෂා කරුණු ලැබුවේ ආර්ථිකයේ විශාල වපසරියකට අදාලව නව ප්‍රාග්ධනය හා කළමනාකරණය ආකර්ෂණීය කර ගැනීමය. රාජ්‍ය අංශයේ අයිතිය අත් නොහැරීම විදුලි සංදේශ, ගුවන් ගමන්, වරාය, විදුලි බලය හා බැංකු ක්ෂේත්‍රයට මෙම නව ප්‍රාග්ධනය හා කළමනාකරණය ආකර්ෂණය කරගනු ලැබිණ. පුද්ගලිකකරණය තවදුරටත් රාජ්‍ය අංශය හා බැඳ තැබීම උපාය මාර්ගික වශයෙන් වැදගත් නොවූ අංශවලට පමණක් අදාළ කරනු ලැබිණි. තීරණාත්මක වශයෙන් වැදගත් වන්නා වූ විදුලිය, වරාය, ජල සම්පාදනය, රාජ්‍ය බැංකු අංශවල, රාජ්‍ය අයිතිය පවත්වාගෙන යමින්ම එවා තවදුරටත් බලගැන්වීම සඳහා රජය බාහිර ආධාර සොයමින් එවායේ කළමනාකරණය ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කර තිබේ.

ආනයන සීමා නිදහස් කිරීමත් සමග ධෛර්යයක් ලබාගත් පුද්ගලික අංශයේ ආයෝජන නිසාද, සිමෙන්ති, ටයර්, වානේ, පිගන් භාණ්ඩ, රෙදිපිළි, බස් ප්‍රවාහනය වැනි අංශ පුද්ගලිකකරණය කිරීම නිසාද ආර්ථිකයේ රාජ්‍ය ඒකාධිකාර ගණනාවක් අවසන් විය. බැංකු හා රක්‍ෂණ ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීම සඳහා තිබූ වෙළඳ පොල ප්‍රවේශ සම්බාධක ඉවත් කිරීම නිසා බැංකු, මූල්‍ය හා රක්ෂණ යන අංශවල තරගකාරීත්වය වර්ධනය වී තිබේ.

වසර කිහිපයකට පෙර රාජ්‍ය ඒකාධිකාරය යටතේ පැවති සේවාවන්වූ ගෑස් සහ ජාත්‍යන්තර දුරකථන සේවා යනාදියේ රාජ්‍ය ඒකාධිකාරිය අවසන් කිරීම නිසා එම ක්ෂේත්‍රවල ක්‍රියාකාරීත්වයට පුද්ගලික අංශය දිරියක් ලබාදී තිබේ.

ඒ ආකාරයට මේ වන විට දුම්රිය ප්‍රවාහනය හැරුණු විට ආර්ථිකයේ කිසිම උප අංශයක් රාජ්‍ය ඒකාධිකාරියට යටත්වී නැත. ඒ අනුව බැංකු, රක්‍ෂණය සහ පොකුරු බස් සමාගම් යනාදී රාජ්‍ය අංශවලට පුද්ගලික අංශය මගින් ඉදිරිපත් කරන්නාවූ තරගය වැඩිවී ඇත.

පසුගිය රජය කාලයේ ගෙනගියා වූ පුද්ගලිකකරණ ප්‍රතිපත්තියේ දුර්වලතා නිසා එවා නිවැරදි කරමින් පුද්ගලිකකරණ ක්‍රියාදාමය විදිමත් කිරීම සඳහා 1996 දී පාර්ලිමේන්තු පණතක් මගින් රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම (පර්ක්) නමැති නව ආයතනය පිහිටුවන ලදී. පුද්ගලිකකරණ ක්‍රියාවලිය විදිමත් කිරීම, විනිවිද භාවය ආරක්‍ෂා කිරීම සඳහා සංවරණ හා තුලනයන් හඳුන්වාදීම, වගකීම් සහිත භාවය ආරක්‍ෂා කර ගැනීම හා පුද්ගලිකකරණය අදාළ ක්ෂේත්‍රයන්හි අත්පත් කරගත යුතු වපසරිය තීරණය කිරීම යනාදිය පර්ක් ආයතනය පිහිටුවීමෙන් බලාපොරොත්තුවූ මූලික අරමුණුය.

අනතුරුව ශ්‍රී ලංකා ටෙලිකොම් සහ එයාර් ලංකා යන ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා රජය මහා පරිමාණ ආයෝජකයන් සමග උපක්‍රමික සන්ධානවලට ඇතුළත් විය. කෙසේ වුවද මේ ආයතන ජාතික ආර්ථිකය සම්බන්ධයෙන් දරන්නාවූ තීරණාත්මක වැඩ කොටස හේතුකොට ගෙන රජය තවදුරටත් බහුතර කොටස් හිමි පාර්ශ්වකරුවාගේ කාර්යභාරය ඉටු කරමින් සිටී.

මේවා තවදුරටත් පවතින්නේ රාජ්‍ය අයිතියට යටත්වය. එහෙත් කළමනාකරණය සිදුවන්නේ පුද්ගලික අංශයෙ පාර්ශ්වකරුවන් මගිනි. දේශීය පුද්ගලික අංශයේ විභවතාව හඳුනාගනිමින් දේශීය ආයෝජනවල දායකත්වය ලබාගැනීමේ අරමුණින් යුක්තව තෝරාගත් කෘෂිකාර්මික හා පශු සම්පත් ගොවිපළ කිහිපයක්ද ජාතික රක්‍ෂණ සංස්ථාවද පුද්ගලිකකරණය කරන ලදී. මේ කාලය තුළදීම බලශක්ති ජනනය, පිටි සැකසුම, වරාය මෙහෙයුම් යන අංශවලට අදාළව පුද්ගලික අංශයේ ආයෝජන බූ බොට් (Boo/Bot) ක්‍රම උපයෝගී කර ගනිමින් දිරිමත් කරණු ලැබිණි.

අපගේ ආර්ථික ප්‍රතිපත්ති මගින් සුළු පරිමාන අංශයේ සංවර්ධනයට ඉහළම ප්‍රමුඛත්වයක් ලබාදෙනු ලැබීය. විද්‍යුත්කරණ වැඩ සටහන්, ග්‍රාමීය, විදුලිබල යෝජනා, ක්‍රම පුනරුත්ථාපනය කිරීම, නිදහස් වෙළඳ කලාප ව්‍යාප්ත කිරීම, පාසල් ගොඩනැගිලි, පුස්තකාලය, සෞඛ්‍ය පහසුකම්, ජල සම්පාදන යෝජනා ක්‍රම, දුරකථන පහසුකම්, කෘෂිකාර්මික අලෙවි කටයුතු, ගබඩා පහසුකම් යනාදිය පුළුල් කිරීමත් කුඩා තේවතු හා රබර්, පොල් වතු ආර්ථිකය නවීකරණය කිරීමත් නිසා ග්‍රාමීය ආර්ථිකය විශාල වශයෙන් ප්‍රාණවත් භාවයකට පත්විය.

පුද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ වර්ධනය කරනු ලබු ආයෝජනයන් මගින් යටිතල පහසුකම් ගොඩනැගීම අපගේ ආර්ථික සංවර්ධන වැඩසටහනේ මූලික පරමාර්ථය විය. ආධාර ලබාදෙන ප්‍රජාවගේ උපකාරය සහිතව අපර මාර්ගද සහිත සුපිරි මාර්ග පද්ධතියක්ද ඉදි කෙරිණි. ජපන් රජයේ හා ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර සහිතව සැකසු ප්‍රධාන ව්‍යාපෘති දෙකක් වන බේස්ලයින් පාර ව්‍යාපෘතියේ වැඩ බොහෝ දුරට නිමවී ඇති අතර කොළඹ - මාතර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ වැඩ මේ වන විට අරඹා තිබේ.

2000 - 2005 පස් අවුරුදු කාලය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා විස්තරාත්මක මහාමාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් සකස් කර තිබේ.

ජාතික නාවික ප්‍රතිපත්ති අනුව කොළඹ, ගාල්ල හා හම්බන්තොට නව වරායන් තුන ඉදි කිරීම හඳුනා ගන්නා ලදුව මෙම ව්‍යාපෘතිවල මූලික කටයුතු වසර 2000 දී ආරම්භ විය. බලශක්ති ජනනය විවිධාංගීකරණයට ලක්කිරීමේ වැදගත්කම හඳුනාගනිමින් කැළණිතිස්ස බලාගාර නව බලශක්ති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරණ ලදී. එවා දැන් බලශක්ති ජනනයේ නියැලී ඇත.

මධ්‍යම පරිමාණ අපනයන පදනම් කරගත් ආර්ථිකයක් සහිතව ජාත්‍යන්තර වෙළඳ පොල කරා ළඟාවීමේ ආර්ථික ඉලක්කයේ අරමුණ වූයේ ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ සුවිශාල වෙළඳ පොල සමග අන්තර් සම්බන්ධතාවක් ඇති කිරීමය. එසේම එය ගෝලීය නිෂ්පාදන සහ බෙදාහැරීම් පද්ධතියට දක්වන දායකත්වය වර්ධනය කිරීමය.

ආර්ථිකයේ තරගකාරී බව වැඩිදියුණු කිරීම පිණිස කර්මාන්ත අංශය නවීකරණය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කෙරිණි. දියුණු රටවල වෙළඳපලට ගැලපෙන උසස් තත්ත්වයේ නිෂ්පාදන බිහිකිරීමට සරිලන ආකාරයට කර්මාන්ත අංශයේ තාක්ෂණය යාවත්කාලීන කිරීමත්, නවීකරණය කිරීමත් ඒවාට අදළ ඇනුම ලබාදීමත් සිදු කෙරුණි.

තාක්ෂණයේ නව මංපෙත් අත්පත් කර ගැනීම, මානව සම්පත් විශාල වශයෙන් හැකියාවන් ඉල්ලා සිටින්නාවූ ක්ෂේත්‍රවලට අදළ මානව සම්පත් සංවර්ධනය, යටිතල පහසුකම් දියුණු ප්‍රදේශ ආශ්‍රිතව කාර්මික නගරායනය, කාර්මික තාක්ෂණික උද්‍යාන ආදී කාර්මික භූමිභාග සපයාදීම ගන්නා ලද පියවරයන්ය.

ග්‍රාමීය ප්‍රදේශවල කෘෂිකර්මාන්තයේ ව්‍යුහාත්මක පරිවර්තනයක් ඇති කිරීම සඳහා කෘෂිකර්මය නවීකරණය කිරීම, කෘෂිකර්මය සංවර්ධනය කිරීමේ මූලෝපායන්හිදී වැදගත් වන්නකි. වෙළඳ පොල ක්‍රමයට අනුගතව එහෙත් ගෝලීය වෙළඳාමේ බලපෑම් වලින් ආරක්‍ෂා කර ගනිමින් කෘෂිකර්මාන්තය නවීකරණය කර විවිධාංගීකරණයට ලක්කර.ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණ, තාක්ෂණය, යටිතල පහසුකම්, ව්‍යාපෘති සේවා සහ මූලික යෙදවුම් ඒකාබද්ධ කළ යුතුව තිබේ.

ගබඩා කිරීමේ හා ප්‍රවාහණ පහසුකම්වලට අදළ ආයෝජන ආකර්ෂණය කර ගනිමින් පළතුරු, එළවළු, ශාක ද්‍රව්‍ය, මල් වර්ග යනාදිය අපනයනයෙන් උපරිම ඵල ප්‍රයෝජනවත් ලබාගත යුතුව තිබේ. යටිතල පහසුකම් සපයමින් ක්‍රියාශීලී ආර්ථික මධ්‍යස්ථාන තුළින් දේශීය වෙළඳ පොල දියුණු කළ යුතුව තිබේ.

අනෙකුත් ලාභදායක වෙළඳ පොල මතුකරන සිටින නිෂ්පාදනවලට අදළව කාබනික හා තාක්ෂණික කෘෂිකර්මාන්තයේද තාක්ෂණය සංවර්ධනය කිරීම සඳහා



වරාය සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කරමින්

පුද්ගලික අංශය දිරිගන්වනු ලැබේ. සත්ව නිෂ්පාදන සඳහා වන දේශීය ඉල්ලුම සපුරාලීමට ද ආනයන ආදේශන දිරිගැන්වීමට ද පශු සම්පත් හා ධීවර අංශයේ නිෂ්පාදන වේගවත් කළ යුතුව තිබේ. පරිසර හිතකාමී ව්‍යාපෘති පවත්වාගෙන යාම සඳහා වෙරළ තීරය, සාගර පද්ධතිය නාගරික බලපෑම කළමනාකරණ අත්‍යාවශ්‍ය වන්නේය.

කොළඹ ආදර්ශයක් කර ගනිමින් දකුණු ආසියාවේ වාණිජ හා නාවික මධ්‍යස්ථාන ලෙස කටයුතු කරන්නා වූ ද තවත් ආර්ථික මධ්‍යස්ථාන ප්‍රවර්ධනය කිරීමෙන් ප්‍රදේශීය සංවර්ධනයේ තුලනයක් ඇති කිරීමට අපේක්‍ෂා කෙරේ. මේ ක්‍රියාවලිය තුළ රුහුණුපුර, අනුරාධපුර, නුවරඑළිය, ත්‍රිකුණාමලය සහ යාපනය යන ප්‍රදේශවල ප්‍රාදේශීය මධ්‍යස්ථානවලට ඉහළ ප්‍රමුඛත්වයක් ලබාදී ඇත. මෙකී කලාපීය නාගරික සංවර්ධන මධ්‍යස්ථාන, ප්‍රවාහනය, විදුලි සංදේශනය, විදුලිය, ජලය, රෝහල් සහ පොදු පහසුකම් දියුණු කර ගන්නා ද්විතීයක නගර සමග සම්බන්ධ කෙරෙනු ඇත.

සංවර්ධන ක්‍රමෝපායන්ට ඇතුළත් වී තිබෙන නව අධිවේගී මාර්ග ජාලය ප්‍රාදේශීය සංවර්ධනයෙහිලා මහා මාර්ග සංවර්ධනය කොතරම් වැදගත් වන්නේද යන්න මැනවින් පෙන්වා දෙනු ඇත. උතුරු නැගෙනහිර ගැටුම අවසන්කර තිරසාර සාමයක් උදාකර ගැනීම තුළ මේ ක්ෂේත්‍රය උතුර හා දකුණ ඒකරාශී කර ගනිමින් යකස් කරන්නාවූ මහා දැවැන්ත පුනරුත්ථාපන වැඩසටහනක් ඔස්සේ දියුණුවනු ඇත. පොදුජන එක්සත් පෙරමුණ විසින් රටේ දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහනට පදනම් කරගනු ලැබුවේ එළඳයිතා සංවර්ධනය. වෙළඳ පොල සඳහා ප්‍රවේශවීමේ ඉඩකඩ පුළුල් කිරීම, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධය යන අංශ ඔස්සේ තුලනාත්මක සංවර්ධන ප්‍රතිපත්තියක් තුළය. ජීවිත පවත්වා ගෙනයාම සඳහා උපයා ගැනීමට නොහැකිවූවන් සඳහා සුභසාධන දීමනා ලබාදෙනු ලැබේ.

සැළකිය යුතු කොටස් අයිතියකින් යුක්තව විශාලතම වෙළඳ පොල කොටස්කරුවා ලෙස රාජ්‍ය ව්‍යවසාය අංශයක් පැවතීම මගින් පුද්ගලික ඒකාධිකාරයන් අවම කිරීම සහ වෙළඳ පෙල තරගය ප්‍රවර්ධනය කිරීමෙහිලා ප්‍රධාන වැඩ කොටසක් ඉටුකරනු ලැබේ. රාජ්‍ය බැංකු රක්‍ෂණය හා ඇතැම් අංශ ප්‍රතිව්‍යුහගත ගත කළ බස් ප්‍රවාහන සේවා මගින් සිදුකරන සේවාව මගින් ඉතා පැහැදිලිව පෙන්වා දෙන්නේ නියම වෙළඳ පොල තරගයක් සඳහා රාජ්‍ය ව්‍යවසාය අංශයේ පැවැත්ම අත්‍යාවශ්‍ය වන බවය. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශයේ සාමාජික සංවර්ධනය සඳහා රාජ්‍ය ව්‍යවසායන්හි මැදිහත්වීම විශාල වශයෙන්

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

අවශ්‍ය වනතුරු රාජ්‍ය බැංකු, රක්ෂණය, විදුලිය, ජල සම්පාදනය, දුරකථන, මගී ප්‍රවාහනය, තැපැල යනාදී සේවාවන් පුද්ගලීකකරණය කිරීම දුප්පතුන් අතර ආදායම් හා සම්පත් බෙදීයාමේ විෂමතාවන් ඇති කරමින් සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයට හානිකර ආකාරයට බලපානු ඇත.

රජයේ උදව් උපකාර වලින් හෝ රජයේ වගකීමෙන් මිදී විනිවිද පෙනෙන සුළු භාවයෙන් යුක්තව තරගකාරී ආයතන ලෙස මෙම ආයතන ශක්තිමත් කිරීම සඳහා මෙම ව්‍යවසායන්හි වාණිජ්‍ය මුහුණුවර දියුණු කිරීම සඳහා නව කළමනාකරණ හා පරිපාලනය මගින් පහසුකම් සැලසිය යුතුය. මේ සඳහා නීතිමය රාමුවක් සකසා දිය යුතුය. මේ රාජ්‍ය ආයතනවල වගකීම් නිශ්චය කර දක්වමින් එවා පූර්ණ වාණිජ අධිකාරීන් බවට පත් කිරීමට ඉවහල් වන පරිදි එවායේ ගන්නාවූ සියලු තීන්දු තීරණවලට සභාපතිවරුන්, අධ්‍යක්ෂ මණ්ඩල සහ අනිකුත් ප්‍රධාන නිලධාරීන් වගකීම් සහගතවන ආකාරය දක්වා සිටින නව පණතක් ප්‍රතිෂ්ඨාපනය කළ යුතුය.

පොදුජන එක්සත් පෙරමුණේ ආර්ථික ඉදිරි දර්ශනයේ අඩංගු ආර්ථික සංවර්ධනයෙහිලා අපේක්ෂිත ප්‍රධාන ව්‍යුහාත්මක පරිවර්තනය නම් දේශීය ඉතිරි කිරීම් හා ආයෝජන සියයට 35 දක්වා වර්ධනය කරමින් ආර්ථික වර්ධනය සියයට 7-8 දක්වා නංවාලීමය. මේ ඉලක්කය සපුරා ගැනීමට නම් නිරෝගීමත් රාජ්‍ය අංශයක් නිර්මාණය කළ යුතුව ඇත. රාජ්‍ය අංශයේ වියදම් ප්‍රතිඵල කාර්ය සාධනය හා දියුණු මූලය ගනුදෙනු භාවිතාවන් මත පදනම් විය යුතුය. දේශීය ආදායම් බදු හා රේගු දෙපාර්තමේන්තුව විසින් කාර්යක්ෂමව ක්‍රියාත්මක කරනු ලබන සරල බදු ක්‍රමයන් මගින් ජනතා හිතකාමී බදු ක්‍රමයක් හඳුන්වාදීමට පොදු පෙරමුණු ආර්ථික ඉදිරි දර්ශනයේ ඇතුළත් විය. අප බලාපොරොත්තු වන ආර්ථික සංවර්ධනය සඳහා මෙම සැලසුම් සහගත සංවර්ධන ක්‍රමෝපාය 1995 දී ක්‍රියාවට නංවන ලදී. එමගින් සිදු වූ වෙනස්කම් දැක බලා ගත හැකිය. ශීඝ්‍ර ආර්ථික වර්ධනයක් හා සැලකිය යුතු භෞතික ප්‍රතිඵල ලබා ගැනීමට තවත් කාලය ගතවනු ඇත. ස්ථාවර ආර්ථික ප්‍රතිපත්ති සමග ආර්ථිකයේ සිදු වන්නා වූ පරිවර්තනයේ සුභ සාධනය ජනතාව කරා යාමට කිසියම් කාලයක් ගතවනු ඇත.

පුද්ගලීකකරණය හා නිදහස් කිරීම් නිසා වර්ධනය වූ පුද්ගලික අංශය තිබියදී වුවද, ශ්‍රී ලංකා ආර්ථිකය බාහිර බලපෑම් වලින් එන කම්පනයන් හමුවේ අසරණවීම තවදුරටත් දක්නට ලැබේ. එමෙන්ම ආර්ථික වර්ධනයේ ප්‍රතිඵල සාධාරණ ආකාරයට බෙදී ගොස් ද නැත.

ඉහළ ආර්ථික වර්ධනයක් අපේක්ෂාවෙන් පුද්ගලික අංශය මත පවත්නා බැඳියාව වැඩි වුවද පසුගිය විසිපස් වසර පුරා විරැකියාව, යටිතල පහසුකම්, මන්දගාමීව ව්‍යාප්තවීම යන ගැටළුවලට තිරසාර විසඳුම් සොයා ගැනීමට අප අපොහොසත්වී ඇත. මෙසේ තිබියදී පසුගිය වසරවල ඇතිවූ තත්ත්වයන් විසින් මතුකළ අභියෝගවලට මුහුණ පා 2000 - 2002 වර්ෂය වනවිට ආර්ථික වර්ධන වේගය වැඩිකර ගැනීමට අපි සමත් වුවෙමු. 2001 වර්ෂයේදී සිදු වූ පසුබෑම බාහිර සාධකයන් නිසා සිදුවූවකි.

1994 දී සියයට 35 ක් වූ විදුලිබල පරිභෝජනය මේවන විට සියයට 50 දක්වා වර්ධනය වී ඇත. සියයට 13 ක්ව තිබූ විරැකියා ප්‍රතිශතය සියයට 8 දක්වා අඩුවීම තුළින්ද පෙන්නුම් කෙරෙන්නේ ගතවූ කාලය තුළ ආර්ථික වැද්ධියේ ප්‍රතිඵල සාධාරණව බෙදී ගොස් ඇති බවය.

ඉදිරි දශකයේදී ශ්‍රී ලංකාව ආර්ථික වැද්ධිය හා සාධාරණත්වය සහිත ජාත්‍යන්තර මට්ටමේ ස්ථාවර තරගකාරී ආර්ථිකයක් සහිතව සෞභාග්‍යමත් රටක් බවට පත්වනු ඇත.

ශ්‍රී ලාංකික උරුමය හා ගරු පද්ධතීන් සුරකිමින් ප්‍රජාතන්ත්‍රවාදී ආයතන මත පදනම් වූ ජනතා හිතවාදී ක්‍රමයක් ලෙස මෙම ඉදිරි දර්ශනය විවෘත ආර්ථික ක්‍රමයක් තුළ ක්‍රියාවට නැංවෙනු ඇත.

ජනවාර්ගික ගැටුම අවසන්වීම, අත්‍යවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මගින් ගොඩනැගෙන නව පාලනයකට මග පාදනු ඇත. මෙය වනාහි සැමගේ ගරුත්වය, නිදහස, මානව හිමිකම් හා අභිමානය මත පදනම් වන්නාවූ නව පාලනයක් වනු ඇත.

වාරිමාර්ග ව්‍යාපෘතියක් සමාලෝචනය කරමින්



# චන්ද්‍රිකා දර්ශනය

## දේශනවලින් උපුටා ගත් කොටස්

### >> ශ්‍රී ලංකා මහජන පක්ෂයේ නායිකාවක ලෙස පැවැත්වූ කථාවකින් කුරුණෑගලදී (85 - 86 වකවානුව)

"අප විසින් පිළිගත යුතු මූලිකම සත්‍යය නම්, රටෙහි සාමය අවශ්‍ය වන්නේ, දුක් විඳින සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනතාවගේ විමුක්තිය සඳහා පමණක් නොව සමස්ත ශ්‍රී ලාංකිකයන්ගේම විමුක්තිය සඳහා බවයි."

### >> දිවුලපිටියේදී 1986 අගෝස්තු 14 වැනිද

"මිනිස් ඝාතන වැළැක්වීම සඳහාත්, සාමකාමී වාතාවරණයක් නිර්මාණය කරනු සඳහාත්, ජනවාර්ගික ප්‍රශ්නය විසඳනු පිණිස මහජන පක්ෂය, සිය සහයෝගය දෙන්නේය. පළාත් සභා නිසා රට කිසිදක නොබෙදෙන්නේය."

### >> ශ්‍රී ලංකාවේ ජනාධිපතිනිය එක්සත් ජාතීන්ගේ සමාජ සංවර්ධනය පිළිබඳ ලෝක නායක සමුළුව අමතමින් 1995 මාර්තු 12 වැනිද

"සාමයෙන් සහ සුරක්ෂිතභාවයෙන් තොරව සමාජ සාධාරණය අත්කර ගැනීමට නොහැකි බව අපේ අත්දැකීම් විසින් මැනවින් පැහැදිලි කරනු ලැබ තිබේ."

"ශ්‍රී ලංකාවේ සියලු ජනකොටස්වලට ස්වකීය අනන්‍යතාවන් ප්‍රකාශයට පත් කිරීමටත්, ජාතික ජීවිතයට සාමූහිකව සහ සම්පූර්ණයෙන් සහභාගිවීමටත් අවශ්‍ය වනුයේ, ප්‍රශ්නයට අදාළ සියලු දෙනා සමග ඉවසිලිවන්තව කරන්නාවූ සංවාදයක් මගින් උතුරු නැගෙනහිර ප්‍රශ්නයට එළඹ ගන්නාවූ සාමකාමී විසඳුමකි."

### >> නුගේගොඩදී (85 - 86 වකවානුව)

"මේ යුද්ධය විශාල හිසරදයක්. සිංහල බෞද්ධයන්ට අයිතිව තිබුණ ඉඩම් අක්කර දසලක්ෂ ගණනින්, පරදේශක්කාරයනට පවරා දෙන විටත්, භික්ෂුන් වහන්සේලාට පහර දෙන විටත්, රටේ කර්මාන්ත කැබලි කොට විකුණන විටත්, දකින්නට පවා නොසිටි සිංහල බෞද්ධ නායකයෝ දැන් යුද්ධය දිග්ගැස්සීමේ වාතාවරණයක් නිර්මාණය කරමින් සිටිති."

### >> සුදු නෙළුම් ව්‍යාපාරය අරඹමින් 1995 ජුලි 8 වැනිද කොළඹදී

"මේ රටේ ජාතික රටාවෙහි ගෙත්තම් වන ලෙසින් අපේ සමාජ, සංස්කෘතික සහ දේශපාලන ක්ෂේත්‍රයන්හි ශ්‍රී ලාංකික පොදු අනන්‍යතාවක් සහ පොදු ස්වරූපයක් සකසා වර්ධනය කිරීමට අප අසමත්ව තිබීම, ඇත්ත වශයෙන්ම ඛේදනීය වරදක් ලෙසින් පිළිගත යුතුව තිබේ. එබැවින් අද අප සියලු දෙනාම හමුවේ තිබෙන විශාලම අභියෝගය බවට පත්ව තිබෙන්නේ අප රටේ වෙසෙන සිංහල බෞද්ධයන්, සිංහල කිතුනුවන්, දෙමළ හින්දූන්, දෙමළ කිතුනුවන් සහ මුස්ලිම් ඇතුළු සියලු ජනකොටස් එක්සත් කරන ශ්‍රී ලාංකික පොදු අනන්‍යතාවෙකින් හා පොදු ස්වරූපයකින් යුත් ශක්තිමත් ශ්‍රී ලාංකික ජාතියක් ගොඩනැගීමය."

"ජනගහනයෙන් අති බහුතරය වන සිංහල බෞද්ධයන්ද, සියලු සුළුජන කොටස්ද, ආගමික කොටස්ද ඇතුළු සියලු ජනතාවනට සහෝදරත්වය පිළිබඳ හැඟීමෙකින් බැඳී, සමාන අයිතිවාසිකම් භුක්ති විඳිමින් එකට ජීවත් විය හැකි එක රටක් ගොඩනැගීමට හැකිය."

"එම ප්‍රශ්නයට තිරසාර විසඳුම වනුයේ අන් කිසිවක් නොව දේශපාලන විසඳුමක් පමණි."

## 1996 පෙබරවාරි 4 වැනිද නිදහස් දිනයේදී

"ජනවාර්ගික ප්‍රශ්නයටත්, එම ප්‍රශ්නයේ බේදනීයවූත්, භයංකරවූත් විපාකවලටත් දේශපාලනමය මාර්ගයෙන් විසඳුමක් සෙවීමට මගේ ආණ්ඩුව තිර අදිටනින් යුතුව දිගටම කැපවී සිටී. අපි සාමය සඳහා සාකච්ඡා මග තෝරා ගනිමු. සාමය සඳහා යුද්ධයක් කරන්නට අපට බල කරනු ලැබුවේ එල්.ටී.ටී.ඊය විසිනි. සාමය සඳහා වන අපේ වැඩපිළිවෙල නිවැරදි බව පෙන්වාදීමටත් එය ක්‍රියාවට නැගීමටත් අවශ්‍ය සෑම ක්‍රියා මාර්ගයක්ම ගැනීමට අපි නොපැකිළෙමු."



## ශ්‍රී ලංකා ආර්ථික සහයෝගිතා කමිටුවේදී (සෝල් නුවර, දකුණු කොරියාව) 1996 අගෝස්තු 13 වැනිද

"ස්වකීය අනන්‍යතාව ප්‍රකාශ කිරීමටත් ජාතික මට්ටමින් හෝ පළාත් මට්ටමින් හෝ ප්‍රාදේශීය මට්ටමින් හෝ ජාතික ජීවිතයට සම්පූර්ණ ලෙස සහභාගිවීමටත් සෑම ජනකොටසටම අවස්ථාව දිය යුතුය."

"... ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් සාර්ථක වනුයේ පුද්ගලයනට තම ඉරණම තමන් විසින්ම තීරණය කරගනු ලැබීමට හැකිවන පරිදි, ප්‍රාදේශීය නියෝජිත ඒකක සමග බලය බෙදා ගැනීමෙනි."

"... ත්‍රස්තවාදය යුද්ධමය මාර්ගයෙන් මැඩ පැවැත්විය හැකි නමුත් එවැනි මාර්ගවලින් ජනවාර්ගික ප්‍රශ්නය විසඳිය නොහැකිය. සුළු ජන කොටස්වල සමාජ - ආර්ථික හා දේශපාලන ප්‍රශ්න තිරසාර ලෙස විසඳීමට හැකි වනුයේ සංවාදයෙන් සහ දේශපාලන සම්මුතියෙන් පමණි."



## නිදහස් දින දේශනයේදී 1997 පෙබරවාරි 4 වැනිද

"මා කථා කරන්නේ අපේ ජාතිකත්වයේ අර්බුදය ගැනයි. මෙය එසේ මෙසේ අර්බුදයක් නොවේ. එය කොතරම් උග්‍රවී තිබේදයත්, එක්සත් ශ්‍රී ලංකාවක් තුළ සහෝදරත්වයෙන් ජීවත්වූ විවිධ ජන කොටස්වල ඇතැම්හු අවි භාවිතා කරමින් හා ත්‍රස්තවාදී ක්‍රියාකරමින් වෙනම රාජ්‍යයක් ඉල්ලා සිටිති. අනෙක් අය සෙස්සන් අභිබවන පරප්‍රසාද ඉතාම මුරණ්ඩු ලෙස ඉල්ලා සිටිති."

"අපි අපේ පොදු ශ්‍රී ලාංකික අනන්‍යතාවේ ශක්තිය කෙරෙහි තිරසාර ලෙස තදින්ම බැඳී සිටින අතරම. එක්සත් එක් රටක් ගොඩනැගීම වෙනුවෙන් යළි කැපවෙමු."

## ශ්‍රී ලංකාවේ 50 වැනි නිදහස් සංවත්සරය ද - 1998 පෙබරවාරි 4 වැනිද

"ජාතිය ගොඩනැගීමේ අත්‍යවශ්‍ය කාර්යය සපුරාලීමෙහි අපි අපොහොසත්වී ඇත්තෙමු. ආසියාවේ අපේ අසල්වැසි රටවල් සහ සෙසු බොහෝ රටවල් විවිධ ජනවර්ගවලට, විවිධ ආගම්වලට අයත් විවිධ භාෂා කථා කරන විවිධ ජනකොටස් සමගියෙන් ජීවත් වන ශක්තිමත් හා එක්සත් ජාතීන් ගොඩනගා ඇති අතර අපි මග දිගටම ඒ මේ අත යමින් පැකිළෙමින් ගාටමින් සිට ඇත්තෙමු. එම තත්ත්වයට හේතු සෙවීමත්, වරදකරුවන් සෙවීමත් ඉතිහාසඥයනට භාර කරමු. ජාතියට මග පෙන්වීමේ හා ජාතික ආණ්ඩු කිරීමේ වගකීම භාරගෙන සිටින අපි, අපේ දේශපාලන සබැඳියාවන් කුමක් වුවත්, පටු පෞද්ගලික හෝ දේශපාලන හෝ වාසි පිළිබඳ පහත් ආශාවන් පැත්තකට දමා අනාගතය වෙත එක්සත්ව ඉදිරියට ගමන් කරමු. අද ජාතියේ අවශ්‍යතාව කොතරම් විශාලද, කොතරම් හදිසිදයත්, එයින් අවකාශ සැලසී තිබෙන්නේ පටුවුත්, අදළ නොවන්නාවුත් සියලු දේ අභිබවමින් ජාතික උන්නතියට මග පාදන හදවතෙහි සහ සිත්සතන්හි සියල්ල කෙරෙහි පැතිරුණු පරිත්‍යාගශීලීත්වයට පමණි."

"පුද්ගලයෙකුට හෝ ජාතියකට හෝ ඉහළම හිණි පෙත්තට නැගීමට ඉතිහාසයෙන් ලැබෙන්නේ අවස්ථාවන් සුළු සංඛ්‍යාවක් පමණි. අපට එවැනි බොහෝ අවස්ථා මගහැරී තිබේ. අවස්ථාවන්ගෙන් පිරුණු මේ අන්තිම මොහොත අහිමිකර ගැනීමට අපට නොහැකිය. අප එය කිසිසේත් අහිමි නොකරගත යුතුය."

## ශ්‍රී ලංකාවේ 51 වැනි නිදහස් සංවත්සරය ද 1999 පෙබරවාරි 4 වැනිද

"මගේ ආණ්ඩුව අපේ රටේ ජනවාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමකට එළඹෙනු පිණිස, යෝජනා මාලාවක් සකස් කිරීමේ හදිසිවුත් විවිධ මතබේදවලට තුඩුදී තිබෙන්නාවුත් කාර්යයෙහි නිරතවී ඇත්තෙමු. මේ ප්‍රශ්නයට කෙලින්ම අත තැබීමට ඉමහත් ධෛර්යයක් සහ දැක්මක් අවශ්‍ය විය. ආණ්ඩුවේ සෑම මට්ටමකදීම තීරණ ගැනීමේ පූර්ණ හවුල්කරුවන් සහ කොටස්කරුවන්වීමේ අයිතිය සෑම ජනවාර්ගික කොටසකටම බලය පැවරෙන විස්තීර්ණ යෝජනා මාලාවක් මගේ ආණ්ඩුව විසින් දැන් පාර්ලිමේන්තුව හමුවට ඉදිරිපත් කරනු ලැබ තිබේ. එම ව්‍යවස්ථාමය මුල පිරීමේ අරමුණ අවිචාර අත්තනෝමතිකභාවය සහ අනුන් නොඉවසීමේ වෙනුවට අවබෝධයත්, සැකය වෙනුවට විශ්වාසයත් ජනිත කිරීම සහ පලදායක හවුල්කාරත්වයත්, බලය පැවරීම මගින් එම දුර්ගුණ ඉවත් කිරීමත්ය. එම යෝජනා ක්‍රියාවට නැගුණ විට, සියලුම ජාතිවල, සියලුම ආගම්වල, සියලුම සංස්කෘතික හා සමාජ පසුබිම්වල සහ විවිධ භාෂා කතා කරන සියලු දෙනාටම එක්වී ශක්තිමත් හා එක්සත් රටක් ගොඩනැගීමට ශක්තිමත් පදනමක් ඉදිවන්නේය."



දේශනවලින් උපුටා ගත් කොටස්

## >> ජනාධිපතිවරණයට පෙර 1999 දෙසැම්බර් 14 වැනිද කොළඹදී

"මම අප රටෙහි පැවති වෙනත් ස්වරූපයක දේශපාලන ප්‍රචණ්ඩත්වයේ අල්තාරය මත පියෙකුත්, ස්වාමිපුරුෂයෙකුත් පරිත්‍යාගකොට ඇත්තෙමි. යුද්ධයට අවසානයකුත් ජන වාර්ගික ප්‍රශ්නයට විසඳුමකුත් සෙවීමට ඔබට තිබෙන කැක්කුම මෙන්ම මටද කැක්කුමක් තිබෙන බව දෙමළ ජනතාවට සහතික වීමට මම අදහස් කරමි."

".... මේ රටෙහි ජනවාර්ගික ප්‍රශ්නයක් තිබේ. එයට තිබෙන කල්පවතින එකම විසඳුම දේශපාලනමය සාකච්ඡා මගින් එළඹෙන එකගතාවෙකි."

".... පසුගිය දශක තුළ ඔබත් මාත් අත්දුටු භීෂණය. අපේ දරුවනට උරුමකර දීමට මම අදහස් නොකරමි. එබැවින්, අපි ප්‍රබුද්ධවුත්, එක්සත්වුත්, ජාතියෙක ජීවයෙන් හා ජවයෙන් පිරුණු ශ්‍රී ලංකාවක් යළි ඉදිකිරීම සඳහා සාමයෙන් හා සමාදනයෙන් නව සහශ්‍රකයට ප්‍රවිෂ්ට වෙමු."

## >> ජාතිය අමතමින් 2000 මැයි 8 වැනිද

"අපේ රටෙහි සාමය සහ දේශපාලන ස්ථාවරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීමෙන් තොරව අඛණ්ඩ ආර්ථික වර්ධනයක් අත්කර ගැනීමට නොහැකිය. එය හැකි වනුයේ ශ්‍රී ලාංකික සෑම පුරවැසියෙකුටම, ඔහුගේ හෝ ඇයගේ හෝ ජාතිය, ආගම් හෝ දේශපාලන අදහස් හෝ කුමක් වුවත් ගෞරවයෙන් සහ සමාන අවස්ථා ඇතිව ජීවත්වීමේ අවස්ථාව උදවු විටය."

## >> දෙවැනි වරටත් ජනාධිපති පදවියට තේරී පත්වීමෙන් පසු ජාතිය අමතමින් 1999 දෙසැම්බර් 22 වැනිද කොළඹදී

"අපි අපේ ආගම්වල ඉගැන්වීම් අනුව කළ යුතු දේ කරන්නට අදිටන් කර ගනිමු. සෙසු සියලු අරමුණු මුදුන් පමුණුවා ගැනීමට පෙර, අතිශයෙන්ම දුෂ්කරවුත්, අතිශයෙන්ම දැවෙන්නාවුත් ප්‍රමුඛත්ව ඉලක්කය වන සාමය සපුරා ගැනිමට පටු අදහස් උදහස්. වෛරය සහ වෙනස්කම් දුරලමු."

## >> 52 වැනි නිදහස් සංවත්සරයේදී 2000 පෙබරවාරි 4 වැනිද

"අද අපේ රටට නිදහස දිනාගනු ලැබුවේ ශ්‍රී ලාංකීය ජනතාවගේ අභිප්‍රාය රජකරවනු සඳහාය. සියලුම ශ්‍රී ලාංකිකයනට ආර්ථික සමෘද්ධිය සහ සමාන අවස්ථා උදකර ගැනීම සඳහාය. අප සැම දන්නා පරිදි, පහසුවෙන් මුදුන්පමුණුවා ගැනිමට හැකියාව තිබුණු එම සරල අරමුණ මේ ජනවාර්ගික ගැටුම විසින් දශක දෙකක් තරම් කාලයක් තිස්සේ නිෂ්ප්‍රභා කරනු ලැබ තිබේ."

"අපි මේ රටේ සෑම පුරවැසියෙකුටම සමාන අවස්ථා සලසාදීමට උනන්දුවන් දිගටම ක්‍රියා කළ යුතු වෙමු. අපි දේශපාලන බලය බෙදා ගත යුතු වෙමු. ඒ සියල්ල ව්‍යවස්ථානුකූලව සහතික කළ යුතු වෙමු."

## >> ජනාධිපති ලේකම් කාර්යාලයේදී 2000 මැයි 15 වැනිද

"මම සිංහල බෞද්ධයෙක්මි. එහෙත් මේ ආණ්ඩුව මේ රටේ ජීවත්වන සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් සහ මැලේ ඇතුළු සියලු ජනවර්ගවලට අයිතිය. මේ ආණ්ඩුව ක්‍රියාකරන්නේ ඒ සියලු ජනකොටස්වල අවශ්‍යතාවන් අනුවය."

දේශනවලින් උපුටා ගත් කොටස්

## ඔක්ස්ෆඩ් සංගමය අමතමින් 2001 ඔක්තෝබර් 29 වැනිද

"ත්‍රස්තවාදයට දැක්විය හැකි අතිශයින්ම ඵලදායක ප්‍රතිචාරය නම්, එය ජනිත කිරීම නවතා දැමීම බව මම අවංකවම හා තරයේ විශ්වාස කරමි."

## නේපාලයේ කත්මණ්ඩු නුවර පැවති 11 වන සාර්ක් ඉහළ පෙළේ සමුළුව අමතමින් - 2002 ජනවාරි 5 වැනිද

"අපේ ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් ලබාදීමට අපි අපොහොසත්වී ඇත්තෙමු. අපට එරෙහිව ඇතැයි අප විශ්වාස කළ අසාධාරණත්වය පිළිබඳ අපේ අවබෝධය දීර්ඝ කාලයක් මුළුල්ලේ එසේම තිබෙන්නට ඉඩ හැරීමේ ප්‍රතිඵලය වුයේ විසඳුමක් සොයා අවංකව සාකච්ඡා ආරම්භ කිරීමට බාධා පැමිණීමයි. අවසානයේ අපේ අරමුණ විය යුත්තේ අපේ රටවල හාමතේ වෙසෙන කෝටි සංඛ්‍යාත ජනතාවගේ ප්‍රශ්නවලට ප්‍රායෝගික විසඳුම් ලබාදීමයි."

## මාධාවිරාඕ සින්දියා අනුස්මරණ දේශනයේදී 2002 අප්‍රේල් 23 වැනිද නව දිල්ලියේදී

"ලොව බොහෝ රටවලට විශේෂයෙන්ම දකුණු ආසියාවට 21 වැනි සිය වසරේ අභියෝගයට පවතිනු ඇත්තේ බහු වාර්ගික බහු සංස්කෘතික ජාතික රාජ්‍යයන් ගොඩනැගීමේ කාර්යයයි. එය සපුරා ගැනීම සඳහා අපේ ජාතීන් ඇතුළත පවතින විවිධත්වය කළමනාකරණය කෙරෙන, එම විවිධත්වයේ සරුබව අර්ථවත් වෙනස්කම් සඳහා ඇත්ත වශයෙන්ම යොමු කළ යුතු වන්නේය."

"ඒ සියල්ල මුදුන්පමුණුවා ගැනීම සඳහා අප කළ යුත්තේ විවිධත්වයන්ගේ ආඪ්‍යබවින් ශක්තිය උරගා ගැනීමට ඉගෙන ගැනීමට මිස වෙනස්කම් ප්‍රතික්ෂේප කරමින් විවිධත්වය ගැටුම්වලට උසිගැන්වීම නොවේ."

"ඉන්දියාව, ප්‍රමාණවත් ස්ථාවර දේශපාලන ක්‍රමයක් පවත්වාගෙන යන අතරම, රට තුළ තිබෙන අසීමිත විවිධත්වයන් සමග පැවැතීමටද සමත් වී තිබේ. ජාති, ආගම් සහ භාෂා ආදිය අතින් ඉන්දියාවට වඩා බොහෝ සෙයින් අඩු විවිධත්වයක් පවතින ශ්‍රී ලංකාවේ අපි ජාතිය ගොඩනැගීමේ අත්‍යවශ්‍ය කාර්යයේදී නන්නත්තාර වී ඇත්තෙමු. නියම බහුවිධ ජාතික රාජ්‍යයක් ගොඩනැගීමේ ප්‍රශ්නය විසඳීමට අපි අපොහොසත්ව සිටිමු."



## >> කොළඹ පැවති ශ්‍රී ලංකා සංවර්ධන සමුළුවේ ප්‍රධාන දේශනය පවත්වමින් - 2002 ජූනි 6

"අපේ රටේ සාමය හා දේශපාලන ස්ථාවරත්වය ස්ථාපිත කරන්නේ නැතිව තිරසාර ආර්ථික වර්ධනයක් ළඟාකර ගත නොහැකිය. මෙම ජයග්‍රහණය ලබාගත හැක්කේ ජාති ආගම් හෝ දේශපාලන භේදවලින් තොරව ශ්‍රී ලංකාවේ සියලු වැසියන්ට අභිමානයෙන් යුතුව සමාන අවස්ථා භුක්තිවිඳීමට අවස්ථාව ලැබෙන විට පමණි."

## >> ජාතිය අමතමින් 2002 අගෝස්තු 9 වැනිදා

"ළඟා කර ගැනීමට අපි සියලු දෙනාම වීරිය කරන සාමය ඇති කරගත යුත්තේ මේ රටෙහි ජීවත්වන සියලු ජාතිකයනට සමාන අයිතිවාසිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදී නිදහස සහතික කෙරෙන රාමුවක් ඇතුළතය."

"සාකච්ඡාවල ඉලක්කය විය යුත්තේ දෙමළ ජනතාවගේ ප්‍රශ්න නිරාකරණය කිරීමට ආධාර වන අතරම සිංහල සහ මුස්ලිම් ජනතාවනට සාධාරණය ඉටුවන ආකාරයට රාජ්‍යයේ ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීම තුළින් ජනවාර්ගික ගැටුමට ස්ථිර විසඳුමක් වෙත එළැඹීමය. මූලික ප්‍රශ්නය එයයි."

"උතුරේ හා නැගෙනහිර දෙමළ ජනතාව පැසිස්ට් ත්‍රස්තවාදයේ දේශපාලනයට පැහැදිලිවම විරුද්ධය. ඔවුන් ඉල්ලා සිටින්නේ ශ්‍රී ලාංකිකයන් වශයෙන් හිමි විය යුතු අයිතිවාසිකම් භුක්තිවිඳිමින් ශ්‍රී ලාංකිකයන් ලෙස ගෞරවයෙන් ජීවත්වීමේ අවස්ථාවයි."

## >> ජනවාර්ගික සාමය පිළිබඳ ජාතික උපදේශ සභාව අරඹමින් 2002 ජූලි 26 වැනිදා

"යුද්ධ ජය ගැනීමෙන් පමණක් සාමය උදාවන්නේ නැත. කල්පවතින්නට නම් සාමය ජනතා හදවත් සහ සිත් තුළද උදා කළ යුතුය."

"... අපි අපේ සියලු ජනතාවන් අතර හැකිතාක් ප්‍රබල මට්ටමින් අදහස් විමසීම් සහ සංවාද පැවැත්වීම ඇරඹිය යුතු වෙමු. ජනවාර්ගික සමගිය හා සමාදානය උදාකරනු සඳහා කෙනෙකුගේ ජනවර්ගය, ආගම, දේශපාලන මතවාද හා ඇදහිලි නොසලකා, ඒ සියලු දෙනාගේම අදහස් විමසිය යුතුය. ඔවුන් සමග සංවාද පැවැත්විය යුතුය. එවිට, සාම ක්‍රියාදාමයෙහි සත්‍යවශයෙන්ම හා සෘජුවම නිරතව සිටින අයට සාමය සහ ජනවාර්ගික සමගිය සඳහා වන මගෙහි පෙරටයාමේදී ඔවුන්ගේ අදහස්, යෝජනා සහ ප්‍රශ්න සැලකිල්ලට ගැනීමට හැකිවනු ඇත."




දේශනවලින් උපුටා ගත් කොටස්

# සාමය සහ ළමුන් සඳහා ජාත්‍යන්තර නියෝජනය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කොෆී අනන් සමග



2002 මැයි - ළමුන් සඳහා වූ එක්සත් ජාතීන්ගේ විශේෂ සැසිවාරයන්හිදී යුනිසෙෆ් ප්‍රධානී කැරල් බෙලමි සහ බිල් ගේට්ස් සමග



ශ්‍රී ලංකාවේ චාරිකා කළ අතිඋතුම් ජෝන් පෝල් දෙවෙනි පාප් වහන්සේ සමග



හිටපු දකුණු අප්‍රිකානු ජනාධිපති නෙල්සන් මැන්ඩෙලා සමග

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය

ශ්‍රී ලංකා ජනරජයේ අතිගරු ජනාධිපතිනි
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය
ජනාධිපති ධුරයට පත්වීමේ 8 වන සංවත්සරය

2002 නොවැම්බර් 12

රජයේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.

